THE
ISSUE BRIEF 4.0
BY GREENPEACE South Asia
March 2026

දිත්වා සුළි කුණාටුවෙන් සිදු වූ අලාභ හා හානි දේශගුණික වගකීම් සඳහා වූ සටහන

හැඳින්වීම

දේශගුණික විපර්යාස හේතුවෙන් ඇති වන අසාමාන්‍ය කාලගුණික තත්ත්වයන් පිළිබඳ පුළුල් සන්දර්භය තුළ පිහිටා, දිත්වා සුළි කුණාටුව මගින් ඇති කළ සමස්ත බලපෑම් පරාසය මෙම වාර්තාව මගින් විශ්ලේෂණයට ලක් කෙරේ. සාගර මතුපිට උෂ්ණත්වය ඉහළ යාම සහ කාලගුණ රටා වෙනස් වීම හේතුවෙන් කලාපය තුළ සුළි කුණාටු තීව්‍ර වන අතරම අධික වර්ෂාපතනයක් ඇති වන බව විද්‍යාත්මක සාධක මගින් තහවුරු වී ඇති පසුබිමක දිත්වා සුළි කුණාටුව විසින් මෙම ප්‍රවණතාවය තවදුරටත් පිළිඹිබු කරනු ලබයි. මින් අවධාරණය වන්නේ දේශගුණික විපර්යාසය යනු මින් ඉදිරියට අනාගතය සම්බන්ධයෙන් පවතින අවදානමක් නොවන අතර,එය ශ්‍රී ලාංකික ප්‍රජාව දැනටමත් මුහුණ දෙන වත්මන් යථාර්ථයක් බවට පත්ව ඇති බවයි.

මතුපිටින් දිස්වෙන යටිතල පහසුකම්වලට ආර්ථික වශයෙන් සිදුව ඇති හානිවලට අමතරව, විධිමත් ප්‍රතිසාධන මෙන්ම වන්දි ගෙවීමේ යාන්ත්‍රණයන් තුළ බොහෝ දුරට තවදුරටත් හඳුනා නොගත් සැලකිය යුතු සමාජයීය සහ පාරිසරික හානි සහ අලාභ (Loss and Damage - L&D) රැසක් දිත්වා සුළි කුණාටුව හේතුවෙන් සිදුව ඇති බව පැහැදිලි කරුණකි.

මේ අතරට ජීවිත හානි, මානසික කම්පනයන්, අධ්‍යාපනය අඩාල වීම, සංස්කෘතික පුරුදු සහ භාවිතයන් පිරිහීමට ලක්වීම මෙන්ම වනාන්තර, කෘෂිකාර්මික ඉඩම් සහ ජෛව විවිධත්වය වැනි පරිසර පද්ධතිවලට සිදු වූ හානිද ඇතුළත් වේ. පීඩාවට ලක්වූ ප්‍රජාවගෙන් ලබාගත් සාක්ෂි, භූගෝලීය තොරතුරු පද්ධති (GIS) සිතියම් මඟින් ලබාගත් දත්ත සහ ලේඛනගත සාක්ෂි පදනම් කරගනිමින්, මෙම වාර්තාව ජනතාවගේ සැබෑ අත්දැකීම් කෙරෙහි අවධානය යොමු කරයි. එමෙන්ම, හදිසි ප්‍රතිචාර දැක්වීමේදී සහ ආපදාවෙන් පසු ජීවිත යළි නඟා සිටුවීමේ ක්‍රියාන්විතය අතරතුර වඩාත් කැපී පෙනුණ අවදානම මෙන්ම දුෂ්කරතාවයන් හමුවේ යළි ගොඩනැඟීමට ඇති හැකියාවේ සිට ප්‍රජා නායකයින් සහ ප්‍රාදේශීය වශයෙන් ඉස්මතු වූ දිරිය විරුවන්ගේ භූමිකාවන් පිළිබඳ තොරතුරුද මෙහි ඇතුළත් වෙයි.

මෙම ලේඛනය, ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලීන් දැනුවත් කිරීමේ අරමුණින්, ආපදා ප්‍රතිචාර දැක්වීමේදී සහ කළමනාකරණය කිරීමේදී පවතින අඩුපාඩු පිළිබඳ සාක්ෂි සහිත අවබෝධයක් ලබා දෙයි. ජාතික සැලසුම්කරණය සඳහා හානි සහ අලාභ පිළිබඳ කරුණු වඩාත් ප්‍රබල ලෙස ඇතුළත් කිරීම, අවදානමට ලක්විය හැකි ප්‍රජාවන් සඳහා වැඩි ආරක්ෂාවක් සැලසීම සහ දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව සහිත සංවර්ධනය සහ පරිසර පද්ධති ප්‍රතිසංස්කරණය සඳහා වැඩි ආයෝජනයක් සිදු කිරීමේ අවශ්‍යතාවය මින් අවධාරණය කෙරේ. ආපදාවට ලක්වූ ප්‍රජාව මුහුණ දී ඇති සැබෑ තත්ත්වයන් අධ්‍යයනය ඔස්සේ ලබාගත් ක්‍රියාකාරී නිර්දේශ මඟින් ශ්‍රී ලංකාව තුළ වඩාත් සාධාරණ, කිසිවෙකු බැහැර නොකරන සහ ප්‍රගතිශීලි දේශගුණික සහ ආපදා තත්ත්ව පාලනය කිරීමේ ක්‍රමවේදයක් නිර්මාණය කිරීම සඳහා මූලික අඩිතාලමක් සැපයීම මෙම වාර්තාව විසින් අරමුණ කරගනී.

තවද, ශ්‍රී ලංකාවේ ප්‍රජාවන්ට තමන් විසින් නිර්මාණය නොකළ අර්බුදයක පිරිවැය දරා ගැනීමට සිදු වී ඇති ආකාරය අනාවරණය කරමින් දේශගුණික වගවීම පිළිබඳ ගෝලීය කතිකාවට ද මෙය දායක වේ.

එමෙන්ම, හරිතාගාර වායු විමෝචනයට අවම වශයෙන් දායක වූ පුද්ගලයින්ට එහි ප්‍රතිඵලයක් ලෙස වෙන දරුණුතම පාඩු හා හානිවලට මුහුණ දීමට සිදුව තිබීමේ තත්ත්වය සමඟ , දේශගුණික විපර්යාසවල අසාධාරණ යථාර්ථය පිළිබිඹු කරන නිදසුනක් ලෙස දිත්වා සුළි කුණාටුව් සළකුණු කළ හැකි බවද කිව යුතුයි.

මෙම සාරාංශය මඟින් සිදුවූ ආපදා තත්ත්වයේ ආර්ථික හා ආර්ථික නොවන අලාභයන් වාර්තා කරන අතරම, පොසිල ඉන්ධන සමාගම් සහ ප්‍රධාන වශයෙන් වායු විමෝචනය කරන රටවල් ඔවුන්ගේ ක්‍රියාවන්ගෙන් සිදුවන හානියට වගකීම භාර ගත යුතුය යන අදහස ස්ථාපිත කරමින් 'දූෂකයා ගෙවිය යුතුයි' (Polluters Pay Principle) යන මූලධර්මය තවදුරටත් තහවුරු කරයි. එමෙන්ම, හුදු ලාභයට ඉහළින් මිනිසුන්, පරිසර පද්ධති සහ යුක්තිය ඔසවා තබන; පද්ධතිමය වශයෙන් සිදුවිය යුතු පරිවර්තනීය වෙනස්කම් සහ ප්‍රමාණවත් හානි සහ අලාභී පියවීමේ ක්‍රමවේදයක් වෙනුවෙන් ග්‍රීන්පීස් සංවිධානය විසින් ඉල්ලා සිටින පියවර වෙත ශක්තියක් සැපයීමද මෙම කරුණු සාරාංශයෙන් අපේක්ෂා කෙරේ.

දිත්වා සුළි කුණාටුවේ බලපෑම පිළිබඳ දළ විශ්ලේෂණය

2025 නොවැම්බර් 28 වන දින දිත්වා සුළි කුණාටුව ශ්‍රී ලංකාවට ඇතුළු විය. මෙය දැඩි සුළඟට වඩා, දිගුකාලීන හා දැඩි වර්ෂාපතනයක් මගින් පුළුල් හානියක් සිදු කළ දරුණු අඩු පීඩන කාලගුණ පද්ධතියකි. එය වාර්තාගත වර්ෂාපතනයක් සමඟ පැමිණි අතර, දිවයින පුරා පුළුල් ගංවතුර තත්ත්වයක් සහ දරුණු නායයෑම් තත්ත්වයක් ඇති කළේය. දින කිහිපයක් මෙරට තුළ රැඳී තිබූ මෙම පද්ධතිය, මුළු දිස්ත්‍රික්කම යටපත් කරමින් යටිතල පහසුකම් අඩාල කළ අතර, මධ්‍යම කඳුකරයේ සහ ගංගා ද්‍රෝණිවල දරුණු බෑවුම් කඩා වැටීම්වලට (Slope failures) හේතු විය. මිලියන සංඛ්‍යාත ජනතාවක් පීඩාවට පත් කරමින් සෑම දිස්ත්‍රික්කයකටම පාහේ මෙයින් දැඩි බලපෑම් එල්ල විය. සාමාන්‍ය සුළි කුණාටු වෙරළබඩ ප්‍රදේශවලට බලපෑම් කළද, දිත්වා හි දරුණුතම බලපෑම දක්නට ලැබුණේ රට අභ්‍යන්තරයේ, විශේෂයෙන්ම මධ්‍යම කඳුකරයේය. කඳුකර භූමි ප්‍රදේශවලට ඇද හැළුණු අධික වර්ෂාපතනය නායයෑම්, හදිසි ගංවතුර සහ බෑවුම් කඩා වැටීම් උත්සන්න කළේය.

දිත්වා හි ප්‍රධාන ලක්ෂණයක් වූයේ එහි සෙමින් චලනය වන සහ ස්ථාවර ස්වභාවයයි. මෙය පස ජලයෙන් සංතෘප්ත වීමටත්, දින කිහිපයක් පුරා අවදානම තවදුරටත් වර්ධනය වීමටත් හේතු විය. මීට පෙර අධි අවදානම් සහිත ප්‍රදේශ ලෙස නම් කර නොතිබූ ස්ථානවල පවා නායයෑම් සිදුවීමේ ඉහළ ප්‍රවණතාවක් නිරීක්ෂණය විය. සුළඟේ බලපෑමට වඩා වර්ෂාපතනයේ තීව්‍රතාවය සහ ඒ ආශ්‍රිත උපද්‍රවයන් ප්‍රබල වන, දේශගුණික විපර්යාස මඟින් මෙහෙයවනු ලබන නැගී එන ආපදා රටාවන් දිත්වා විසින් පිළිබිඹු කරයි. එමෙන්ම, විශේෂයෙන් අවදානමට ලක්විය හැකි ප්‍රජාවන් , පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති, ආපදා වර්ගීකරණය සහ දේශගුණික අනුවර්තන සැලසුම්කරණයේ පවතින තීරණාත්මක හිඩැස් වෙත දිත්වා සුළි කුණාටුව විසින් මතු කළ තත්ත්වයන් අවධානය යොමු කරවයි.

මානුෂීය බලපෑම

- ජීවිත හානි: මෑත ඉතිහාසයේ වාර්තා වූ ඉහළම මරණ සංඛ්‍යාවකට මෙම ආපදාව හේතු වී ඇති අතර, තහවුරු කරන ලද මරණ 650 කට අධික ප්‍රමාණයක් සහ තවමත් අතුරුදහන්ව සිටින පුද්ගලයින් 173 දෙනෙකු වාර්තා වේ. සහන මෙහෙයුම් තවමත් ක්‍රියාත්මකයි.
- පීඩාවට පත් වූවන්: ගංවතුර, අවතැන්වීම්, නිවාස අහිමි වීම සහ මූලික සේවාවන් අඩාල වීම හේතුවෙන් මිලියන 2.3 කට අධික ජනතාවක් පීඩාවට පත්ව ඇත.
- මානසික සහ සමාජීය බලපෑම: දේපළ හානිවලින් ඔබ්බට, ප්‍රජාවන් මානසික පීඩනයට, ජීවනෝපාය අහිමි වීමට සහ අවිනිශ්චිතතාවයට මුහුණ දී සිටිති. විශේෂයෙන් කාන්තාවන්, ළමුන්, වැඩිහිටියන් සහ ආබාධිත පුද්ගලයින් මෙයින් දැඩි ලෙස පීඩාවට පත්ව ඇත.
- ළමුන් සහ සෞඛ්‍යය: ළමුන් සහ අවදානමට ලක්විය හැකි පිරිස් රෝගාබාධ, කම්පන සහ අධ්‍යාපනය අඩාල වීමේ අවදානමකට මුහුණ දී සිටිති. එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF) වාර්තා කරන පරිදි දහස් සංඛ්‍යාත ළමුන් පිරිසකට කඩිනම් ආධාර අවශ්‍ය වේ.

ආර්ථික, යටිතල පහසුකම් සහ ජීවනෝපායමාර්ග සඳහා සිදුවූ හානි

- යටිතල පහසුකම්: මාර්ග, පාලම්, දුම්රිය මාර්ග සහ උපයෝගිතා සේවාවන් ඇතුළු තීරණාත්මක යටිතල පහසුකම්වලට දැඩි හානි සිදුවී ඇති අතර, එය සහන බෙදා හැරීමට සහ යථා තත්ත්වයට පත් කිරීමේ ක්‍රියාවලියට බාධාවක් වී ඇත.
- නිවාස හානි: නිවාස 114,000 කට අර්ධ වශයෙන් හෝ සම්පූර්ණයෙන්ම හානි වී ඇති අතර, ඉන් නිවාස 6,000 ක් සම්පූර්ණයෙන්ම විනාශ වී ඇත.
- කෘෂිකර්මාන්තය සහ පශු සම්පත්: කෘෂිකාර්මික පවුල්වලින් 30% ක් වගා හානි අත්විඳිති. සාමාන්‍ය වී නිෂ්පාදනය 12% කින් පහත වැටී ඇති අතර, එළවළු නිෂ්පාදකයින්ගෙන් 53% ක්, වෙනත් ක්ෂේත්‍ර බෝග නිෂ්පාදකයින්ගෙන් 34% ක්, ගව පාලකයින්ගෙන් 37% ක් සහ කුකුළු පාලකයින්ගෙන් 63% ක් ගංවතුර සහ පසුකාලීන රෝග ව්‍යාප්තිය හේතුවෙන් පාඩු වාර්තා කර ඇත.
- ධීවර ක්ෂේත්‍රය: ධීවර පවුල්වලින් 28% ක් බෝට්ටු හෝ ධීවර යටිතල පහසුකම්වලට හානි සිදු වූ බව වාර්තා කර ඇත.
- මුළු හානිය: ලෝක බැංකු සමූහයේ GRADE (Global Rapid Post-Disaster Damage Estimation) වාර්තාව ඇස්තමේන්තු කර ඇති පරිදි, නිවාස, කෘෂිකර්මාන්තය සහ අත්‍යවශ්‍ය යටිතල පහසුකම් සඳහා සිදු වූ මුළු හානිය ඇමරිකානු ඩොලර් බිලියන 4.1 ක් පමණ වේ.

පවතින අවශ්‍යතා සහ ප්‍රතිචාර

- ජාතික මට්ටමේ නිලධාරීන්, සන්නද්ධ හමුදා සහ ජාත්‍යන්තර හවුල්කරුවන් සෙවීම්, මුදාගැනීම් සහ සහන සේවා මෙහෙයුම්වල නිරත වෙමින් සිටින අතරතුර, අසල්වැසි රටවල් විසින් ඉංජිනේරු සහාය සහ මානුෂීය ආධාර සපයා ඇත. තවමත් පවතින හදිසි අවශ්‍යතා අතර තාවකාලික නවාතැන්, පිරිසිදු ජලය, සෞඛ්‍ය පහසුකම්, ආහාර, මනෝ-සමාජීය සහාය සහ දිගුකාලීන ඔරොත්තු දීමේ හැකියාව සඳහා වන ආයෝජන ඇතුළත් වේ. පාසල් සහ සෞඛ්‍ය මධ්‍යස්ථාන අඩපණ වී ඇති අතර, එය බලපෑමට ලක් වූ ප්‍රජාවන්ගේ අවදානම් තත්ත්වය තවදුරටත් උග්‍ර කර ඇත.

ආහාර සහ නිවාස අනාරක්ෂිතභාවය

- ජීවිත හානි: මෑත ඉතිහාසයේ වාර්තා වූ ඉහළම මරණ සංඛ්‍යාවකට මෙම ආපදාව හේතු වී ඇති අතර, තහවුරු කරන ලද මරණ 650 කට අධික ප්‍රමාණයක් සහ තවමත් අතුරුදහන්ව සිටින පුද්ගලයින් 173 දෙනෙකු වාර්තා වේ. සහන මෙහෙයුම් තවමත් ක්‍රියාත්මකයි.
- පීඩාවට පත් වූවන්: ගංවතුර, අවතැන්වීම්, නිවාස අහිමි වීම සහ මූලික සේවාවන් අඩාල වීම

රජයේ ප්‍රතිචාරය

දැඩි ලෙස බලපෑමට ලක් වූ දිස්ත්‍රික්කවල ජාතික මට්ටමේ ක්‍රියාමාර්ග සහ සම්පත් බලමුලු ගැන්වීම සඳහා හදිසි අවස්ථාවක් ප්‍රකාශයට පත් කරන ලදී.

දිත්වා (Ditwah) සුළි කුණාටුව ගොඩබිමට ඇතුළු වීමෙන් පසුව, සෙවීම් සහ මුදාගැනීමේ මෙහෙයුම් සම්බන්ධීකරණය කිරීම, සහන බෙදා හැරීම සහ බලපෑම් තක්සේරු කිරීම සඳහා ජාතික රජයේ සහන සම්බන්ධීකරණ අංශය, සන්නද්ධ හමුදා, සිවිල් බලධාරීන් සහ ශ්‍රී ලංකා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය (DMC) සමඟ එක්ව දිස්ත්‍රික්ක පුරා ක්‍රියාත්මක විය.

විශේෂයෙන්ම වඩාත් අවදානමට ලක්විය හැකි පවුල් සඳහා ජීවිතාරක්ෂක සහන (ආහාර, නවාතැන්, සනීපාරක්ෂාව, සෞඛ්‍ය සහ ආරක්ෂාව) සැපයීමේදී ජාත්‍යන්තර සහාය දේශීය ප්‍රයත්නයන් සමඟ සම්බන්ධීකරණය කිරීම සඳහා රජය එක්සත් ජාතීන්ගේ හවුල්කරුවන් සමඟ එක්ව 'මානුෂීය ප්‍රමුඛතා සැලැස්මක්' (HPP) ස්ථාපිත කළේය.

රෝග වැළැක්වීම, ද්විතීයික අනතුරු අවම කිරීම සඳහා සුන්බුන් ඉවත් කිරීම සහ මූලික සේවාවන් (ජලය, සනීපාරක්ෂාව, සෞඛ්‍යය) යථා තත්ත්වයට පත් කිරීම ඇතුළු පශ්චාත් ආපදා කළමනාකරණ කටයුතු සඳහා සහාය වන ලෙස පළාත් පාලන ආයතන සහ පළාත් සභාවලට උපදෙස් දෙන ලදී.

නිවාස නැවත ඉදිකිරීම සහ ජීවනෝපායන් යථා තත්ත්වයට පත් කිරීම සඳහා රජය විසින් 'ශ්‍රී ලංකාව යළි ගොඩනැගීමේ' (Rebuilding Sri Lanka) වැඩසටහන ආරම්භ කරන ලදී. අවතැන් වූ පවුල් සඳහා නිවාස ඉදිකිරීමට මුදල් හෝ ඉඩම් පරිත්‍යාග කරන ලෙස ආයතන සහ පුරවැසියන් දිරිමත් කරන ලදී. දේශීය හා විදේශීය මූලාශ්‍රවලින් රුපියල් බිලියන 3.4කට අධික දායකත්වයක් සමඟින්, 'ශ්‍රී ලංකාව යළි ගොඩනැගීමේ අරමුදල' මේ වන විටත් ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා සැලකිය යුතු මුදලක් රැස් කර ඇත. මූල්‍ය පාඩු අවම කිරීම, කුඩා ව්‍යාපාරවලට සහාය වීම සහ දේශීය ආර්ථික ක්‍රියාකාරකම් නංවාලීම සඳහා සුළි කුණාටුවෙන් පීඩාවට පත් වූ ව්‍යාපාර සඳහා එක් වරක දීමනා සහ ණය ආධාර වැඩසටහන් ඇතුළු පුළුල් මූල්‍ය සහන ක්‍රියාමාර්ග ප්‍රකාශයට පත් කරන ලදී.

ඉන්දියාව විසින් ආරම්භ කරන ලද සාගර් බන්දු (Sagar Bandhu) මෙහෙයුම කලාපයේ විශාලතම මානුෂීය සහන මෙහෙයුම්වලින් එකක් වූ අතර, එය සෙවීම් සහ මුදාගැනීම්, හදිසි ද්‍රව්‍ය සැපයීම, වෛද්‍ය ආධාර සහ ඉංජිනේරු සහාය ලබා දීම සහ යටිතල පහසුකම් අලුත්වැඩියාව සඳහා කාර්ය සාධක බලකායන් යෙදවීම කෙරෙහි අවධානය යොමු කළේය. ශ්‍රී ලංකාවට චීනය සහ පකිස්ථානය වැනි අනෙකුත් රටවලින් ද මානුෂීය ආධාර ලැබී ඇත. මීට අමතරව, ඇමරිකා එක්සත් ජනපදයේ මොන්ටානා ජාතික ආරක්ෂක බලකාය (Montana National Guard) සමඟ ඇති කරගත් අවබෝධතා ගිවිසුමක් හරහා යටිතල පහසුකම් තක්සේරු කිරීම, ප්‍රතිසාධන සැලසුම් කිරීම සහ අනාගත ආපදා ප්‍රතිචාර සඳහා ධාරිතා වර්ධනය පිළිබඳ තාක්ෂණික සහාය සංවර්ධනය වෙමින් පවතී.

ජාත්‍යන්තර දේශගුණික ප්‍රතිපත්ති පිළිබඳ ඉදිරිපත් කිරීම්වලදී ශ්‍රී ලංකාව විසින් සිදු කරන ලද දේශගුණික අනුකූලතාව සහ හානි පිළිබඳ කැපවීම්වලට පුරෝකථනයන් වැඩිදියුණු කිරීම, වෝර්සෝ ජාත්‍යන්තර යාන්ත්‍රණයට (Warsaw International Mechanism) අනුකූලව යාන්ත්‍රණයන් නිර්මාණය කිරීම සහ දේශගුණික විපර්යාස නිසා සිදුවන පාඩු (කෘෂිකර්මය, යටිතල පහසුකම්, ජීවනෝපාය) සඳහා රක්ෂණ ක්‍රම ගවේෂණය කිරීම ඇතුළත් වේ. කෙසේ වෙතත්, මෑතකාලීන ඇගයීම් පෙන්වා දෙන්නේ අයවැය රාමු තුළ දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව සහ ආපදා සූදානම සඳහා නිශ්චිත ව්‍යුහාත්මක ප්‍රතිපාදන නොමැති බවයි. හදිසි සහ ප්‍රතිසංස්කරණ වියදම් මූලික වශයෙන් පියවා ගනු ලබන්නේ ආපදා අවදානම් මූල්‍යකරණ මෙවලම් හරහා නොව, පවතින අයවැය ප්‍රතිපාදන නැවත වෙන් කිරීම් මගිනි.

බලමුලු ගැන්වීමේ මට්ටම ඉහළ වුවද, ප්‍රතිපත්තිමය විවාද සහ බාහිර ඇගයීම් මගින් ආපදා කළමනාකරණයේ, විශේෂයෙන් සූදානම් වීමේ මට්ටම් සහ පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතිවල පවතින ව්‍යුහාත්මක ගැටලු ගණනාවක් ඉස්මතු කරයි. දිත්වා (Ditwah) සුළි කුණාටුවේ පෙර නොවූ විරූ ස්වභාවය නිල ක්‍රියාවලීන් කෙරෙහි දැඩි පීඩනයක් එල්ල කළ අතර, ක්‍රියාකාරී ඉවත් කිරීමේ පියවර සහ පූර්ව අනතුරු ඇඟවීම් බෙදා හැරීමේ දුර්වලතා නිරාවරණය විය. ආපදා අවදානම සඳහා විධිමත් අයවැයක් නොමැතිකම, ජාතික සැලසුම්කරණයේදී දේශගුණික අනුවර්තනය සහ ඔරොත්තු දීමේ හැකියාව සඳහා ස්ථාවර අරමුදල් මූලාශ්‍රවල අවශ්‍යතාවය අවධාරණය කරයි. අලාභ හා හානි සඳහා විධිමත් කැපවීම් තිබුණද, ඒවා තවමත් රක්ෂණ හෝ ප්‍රජාවන් සඳහා වන අවදානම්-සමූහගත වැඩසටහන් වැනි ක්‍රියාකාරී රාමු බවට පරිවර්තනය වී නොමැත.

දේශගුණය සහ වගවීම

ශ්‍රී ලංකාවේ සිදු වූ මෙම ව්‍යසනය මගින් දේශගුණික අවදානම් පැතිකඩෙහි සිදුවෙමින් පවතින පුළුල් වෙනස්කම් පිළිබිඹු කරයි. සාගර ජලය උණුසුම් වීම සහ වායුගෝලය තෙතමනයෙන් බර වීම නිසා වර්ෂාපතනයේ තීව්‍රතාවය වැඩි වනවා පමණක් නොව, ආන්තික කාලගුණික තත්ත්වයන් පවතින කාලසීමාව ද දීර්ඝ වේ. මෙලෙස ගංවතුර සහ නායයෑමේ අවදානම ඉහළ යාම, කුණාටු හැසිරීම් පිළිබඳ මෙතෙක් පැවති උපකල්පන අභියෝගයට ලක් කරන අතර ඓතිහාසික ඍතුමය විචල්‍යතාවයන් ඉක්මවා යයි.

මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් සිදු වූ දේශගුණික විපර්යාස නිසා දිත්වා සුළි කුණාටුව ප්‍රබල වූ බව විද්‍යාත්මක සාක්ෂි මගින් පැහැදිලිවම පෙන්වා දෙයි. මෙහි ප්‍රතිඵලයක් ලෙස දේශගුණික අවදානම්, අවදානමට ලක්විය හැකි බව සහ ගෝලීය වගවීම සම්බන්ධයෙන් ප්‍රබල බලපෑම් ඇති වී තිබේ.

ලෝක කාලගුණ ආරෝපණ සම්මේලනය 'World Weather Attribution' විසින් මෑතකදී කරන ලද විශ්ලේෂණයකට අනුව, 'දිට්වා' (Ditwah) සුළි කුණාටුව සමඟ ශ්‍රී ලංකාවට බලපෑ දින පහක අතිශය දැඩි වර්ෂාපතනය, කාර්මික යුගයට පෙර පැවති උෂ්ණත්වයට වඩා මානව ක්‍රියාකාරකම් හේතුවෙන් සිදුවී ඇති සෙල්සියස් අංශක 1.3 ක පමණ ගෝලීය උණුසුම් වීමක් නොතිබුණේ නම් පවතින තත්ත්වයට වඩා 28% සිට 160% දක්වා අඩු තීව්‍රතාවයකින් යුක්ත වීමට ඉඩ ඇත. උතුරු ඉන්දියන් සාගරයේ මුහුදු මතුපිට උෂ්ණත්වය (1991-2020 සාමාන්‍යයට වඩා සෙල්සියස් අංශක 0.2 කින් පමණ) ඉහළ යාම, වර්ෂාපතනය සහ ගංවතුර අවදානම තවදුරටත් දැඩි කරන අමතර තාපයක් සහ තෙතමනයක් ලබා දීමට හේතු විය.

වායුගෝලයේ උෂ්ණත්වය ඉහළ යන සෑම සෙල්සියස් අංශකයක් පාසාම තෙතමනය රඳවා ගැනීමේ හැකියාව 7% කින් පමණ වැඩි වන බව 'ක්ලෝසියස්-ක්ලැපයිරොන්'(Clausius-Clapeyro) සම්බන්ධතාවය නැමති විද්‍යාත්මක නියමය මගින් පැහැදිලි කරයි. මෙය කුණාටු පවතින අවස්ථාවලදී වඩාත් අධික සහ දිගුකාලීන වර්ෂාපතනයක් ඇති වීමේ හැකියාව වැඩි කරයි.

දේශගුණික විපර්යාස පිළිබඳ අන්තර් රාජ්‍ය මණ්ඩලය (IPCC) නිගමනය කරන්නේ, ගෝලීය උෂ්ණත්වය ඉහළ යාමත් සමඟ අතිශය අධික වර්ෂාපතන අවස්ථා නිතර නිතර සහ වඩාත් තීව්‍ර ලෙස සිදුවන බවයි. දේශගුණය කෙරෙහි මානව බලපෑමක් නොතිබුණේ නම් මෑතකදී සිදු වූ බොහෝ ආන්තික කාලගුණික සිදුවීම් මෙතරම් දරුණු වීමට ඇති ඉඩකඩ ඉතා අවම බව ඔවුන් පෙන්වා දෙයි.

ලා නිනා (La Niña) සහ ඉන්දීය සාගර ද්වීධ්‍රැව (Indian Ocean Dipole) තත්ත්වයන් ඇතුළු ස්වභාවික විචල්‍යතාවයන් මෙවර වර්ෂා රටාවට දායක වුවද, නිරීක්ෂිත දත්ත සහ ඉහළ විභේදනයකින් යුත් දේශගුණික දත්ත මගින් කාලයත් සමඟ වර්ෂාපතනයේ අන්තගාමී බව පැහැදිලිවම වැඩි වී ඇති බව පෙන්නුම් කරයි. ඒ අනුව දිත්වා සුළි කුණාටුව හා බැඳුණු පෙර නොවූ විරූ වර්ෂාපතනයට ප්‍රධානතම හේතුව දේශගුණික විපර්යාස බව තහවුරු වේ.

මේ අතර, වගකීම පිළිබඳ භූ-දේශපාලනික සහ සදාචාරාත්මක පැතිකඩ ඉතා පැහැදිලි චිත්‍රයක් මතු කරයි:

පසුගිය ශතවර්ෂය පුරා වායුගෝලයේ හරිතාගාර වායු එක්රැස් වීමට ප්‍රධාන වශයෙන්ම හේතු වී ඇත්තේ ධනවත් කාර්මික රටවල්ය. විශ්ලේෂණයන්ට අනුව, ඓතිහාසික කාබන් ඩයොක්සයිඩ් (CO_2) විමෝචනයෙන් අඩකට පමණ වගකිව යුත්තේ සංවර්ධිත රටවල් 23කින් සමන්විත කුඩා කණ්ඩායමකි. ගෝලීය උණුසුම ඉහළ යාමට ප්‍රධානතම හේතුව වර්තමාන විමෝචනය පමණක් නොව, ඓතිහාසිකව ඒකරාශී වූ සමස්ත විමෝචනය බැවින්, දිත්වා වැනි කුණාටු තීව්‍ර කරන දේශගුණික තත්ත්වයන් නිර්මාණය කිරීම සම්බන්ධයෙන් කාර්මික ආර්ථිකයන් විශාල වගකීමක් දැරිය යුතුය.

ශ්‍රී ලංකාව සහ තවත් බොහෝ අවදානමට ලක්විය හැකි රටවල් ගෝලීය විමෝචනය සඳහා දායක වී ඇත්තේ 0.1% ක් වැනි ඉතා සුළු ප්‍රමාණයකි. එසේ වුවද, ඔවුන් එහි දරුණුතම ප්‍රතිවිපාකවලට මුහුණ දෙති. මෙය මූලික අසමානතාවයකි: එනම් දේශගුණික විපර්යාස සඳහා අවම වශයෙන් වගකිව යුතු රටවල් එහි නරකම බලපෑම්වලින් අසමානුපාතික ලෙස පීඩා විඳීමයි.

දේශගුණික යුක්තිය සහ ජාත්‍යන්තර දේශගුණික ගිවිසුම්වල මූලධර්ම යටතේ, හරිතාගාර වායු විමෝචනයට වැඩි වශයෙන් වගකිව යුතු පාර්ශවයන්ට, අවදානමට ලක්ව ඇති ජනතාවගේ දේශගුණික හැඩගැසීම් (adaptation), ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීම සහ හානි හා විනාශයන් (loss and damage) සඳහා මූල්‍යමය ආධාර සැපයීමේ සදාචාරාත්මක බැඳීමක් ඇත.

මෙම සාක්ෂි සැලකිල්ලට ගත් විට, දිත්වා සුළි කුණාටුව හුදෙකලා කාලගුණික සිදුවීමක් ලෙස නොව, විද්‍යාත්මකව තහවුරු කළ හැකි දේශගුණික බලපෑමක කොටසක් ලෙස හඳුනාගත යුතුය. මේ සඳහා ඉහළ විමෝචනයක් සිදුකරන රටවලින් වගවීමක් මෙන්ම දේශගුණික අවදානමට ලක්ව ඇති රටවල් සඳහා කඩිනම් සහයෝගයක් ද අවශ්‍ය වේ.

හානි සහ විනාශයන්

දිත්වා සුළි කුණාටුව හේතුවෙන් ශ්‍රී ලංකාව පුරා පුළුල් පරාසයක හානි සහ විනාශයන් (L&D) සිදු විය. මෙයට ආර්ථිකමය හානි මෙන්ම ආර්ථිකමය නොවන හානි ද ඇතුළත් වන අතර, ඉන් දෙවනුව කී හානි වර්ගය නිල ඇගයීම් සහ ප්‍රතිසාධන රාමු තුළ බොහෝ දුරට හඳුනා නොගත් මට්ටමක පවතී. දේශගුණික විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ රාමු සම්මුතියට (UNFCCC) අනුව, 'හානි සහ විනාශයන්' යනු අවම කිරීම (Mitigation) හෝ අනුහුරු වීම (Adaptation) මගින් මඟහරවා ගත නොහැකි, දේශගුණික විපර්යාසවල බලපෑම් හා බැඳුණු හානි වේ. මෙයට විනාශ වූ යටිතල පහසුකම් සහ ජීවනෝපාය වැනි ආර්ථිකමය හානි මෙන්ම; ජීවිත හානි, මානසික සුවතාව පිරිහීම, සංස්කෘතික උරුමයන් අහිමි වීම, සමාජ ඒකාබද්ධතාව බිඳවැටීම සහ පාරිසරික අඛණ්ඩතාවයට සිදුවන හානි වැනි ආර්ථිකමය නොවන හානි හා විනාශයන් (NELD) ද ඇතුළත් වේ.

ආර්ථික හානි සහ ජීවනෝපායමාර්ග විනාශ වීම

දිත්වා සුළි කුණාටුවෙන් සිදු වූ ආර්ථික හානිය ද දරුණු ය. මධ්‍යම කඳුකරයේ තේ කුඩා වතු, කුඹුරු සහ කුළුබඩු වගාවන්ට කෘෂිකාර්මික වශයෙන් දැඩි බලපෑම් එල්ල විය. නිවාස, මාර්ග, පාලම් සහ පොදු පහසුකම් විනාශ වීම හෝ හානි වීම හේතුවෙන් වෙළඳපොළ, සෞඛ්‍ය සේවා සහ අධ්‍යාපනයට ඇති ප්‍රවේශය අඩාල විය.

කෙසේ වෙතත්, ආර්ථික පාඩු වාර්තා වී ඇති අවස්ථාවලදී පවා පවතින වන්දි ගෙවීමේ ක්‍රමවේදයන් ප්‍රමාණවත් නොවන බව ඔප්පු වී ඇත. පවතින සංවර්ධන මතවාදයන් මත පදනම්ව සිය ඉඩම සංවර්ධනය කිරීම සඳහා රුපියල් 500,000ක බැංකු ණයක් ලබාගත් නයපාන ප්‍රදේශයේ ගොවි කාන්තාවකට, නායයෑමක් හේතුවෙන් ඇයගේ නිවස සහ සියලු වගාවන් අහිමි විය. ඇය කිසිදු දිනක ණය වාරික පැහැර හැර නොතිබුණද, ව්‍යසනය සිදු වූ අවස්ථාවේදී ඇයට කිසිදු ණය සහනයක් හිමි නොවීය. ඇයගේ මෙම අත්දැකීමෙන් පෙන්නුම් කරන්නේ මූල්‍ය අවදානම තනි පුද්ගලයන් මත පටවා ඇති ආකාරය සහ දේශගුණික අවදානමට බලපාන පද්ධතිමය සාධක සඳහා වගවීමක් නොමැති බවයි.

මානුෂීය සහ සමාජීය හානි

ශ්‍රී ලංකාවේ මෑතකාලීන ආපදා ඉතිහාසය තුළ වාර්තා වූ ඉහළම මරණ සංඛ්‍යාවකට දිත්වා සුළි කුණාටුව වගකිව යුතු වූ අතර, සිය ගණනක් මියගොස් තවත් බොහෝ පිරිසක් අතුරුදන් විය. මාවතුර සහ කොත්මලේ වැනි ප්‍රදේශවල කඳුකර ගම්මානවල සම්පූර්ණ කොටස් නායයෑම් හේතුවෙන් සේදී ගියේය. අතිනවීන උපකරණ සහිතව එක්සත් අරාබි එමීර් රාජ්‍යයෙන් මෙරටට එවූ විශේෂිත ආපදා මුදාගැනීමේ කණ්ඩායමකට පවා, අස්ථාවර භූමිය යට වැළලී සිටි පුද්ගලයින් හය දෙනෙකුගේ සිරුරු ගොඩගැනීමට නොහැකි වූ බව ප්‍රදේශවාසීහු පවසති.

විපතට පත් පවුල්වලට තම ආදරණීයයන්ගේ දේහයන් සොයා ගැනීමට නොහැකි වීම නිසා අවසන් කටයුතු සිදු කිරීමට ද නොහැකි වී ඇති අතර, එය ඔවුන්ගේ ශෝකය නිමාවක් නොමැති තත්ත්වයකට පත් කර ඇත. මෙය ආර්ථිකමය නොවන හානියක බරපතල ස්වරූපයකි: එනම් මූල්‍ය වන්දි, රක්ෂණ හෝ තාක්ෂණික මැදිහත්වීම් හරහා විසඳිය නොහැකි සංස්කෘතික සහ මනෝවිද්‍යාත්මක හානියකි.

අවතැන් වීම නිසා සමාජීය සහ මානසික හානි තවදුරටත් උග්‍ර වී ඇත. පවුල් ඒකක සති හෝ මාස ගණනාවක් කඳවුරු, පන්සල් සහ පාසල්වල ගත කර ඇති අතර, ඔවුන්ගේ නිවෙස් කරා යාම ආරක්ෂිතද යන්න පිළිබඳව පැහැදිලි සන්නිවේදනයක් පවා ඔවුන්ට ලැබී නොමැත. මෙහිදී කාන්තාවන් සතු වගකීම අසමානුපාතික ලෙස ඉහළ ගොස් ඇත; අධික තදබදය, පෞද්ගලිකත්වය අහිමි වීම සහ අවිනිශ්චිතභාවය මධ්‍යයේ දරුවන්ගේ රැකවරණය, අධ්‍යාපනය සහ මානසික පීඩනය කළමනාකරණය කිරීමට ඔවුන්ට සිදු වී ඇත. දරුවන්ගේ පාසල් අධ්‍යාපනය දීර්ඝ කාලයකට අඩාල වී ඇති අතර, සුළු වර්ෂාවකදී පවා ඔවුන් තුළ දැඩි භීතියක් සහ කම්පනයක් (Trauma) ඇති වේ. වැඩිහිටියන්ට තම පාරම්පරික ඉඩම් අහිමි වී ඇති අතර, ප්‍රජාව සහ ප්‍රදේශය හා බැඳුණු ඔවුන්ගේ සමාජීය භූමිකාවන් ද ගිලිහී ගොස් ඇත.

භූමිය, සංස්කෘතිය සහ අනන්‍යතාව අහිමි වීම

බලපෑමට ලක්වූ කඳුකර ප්‍රදේශවල භූමිය යනු හුදෙක් ආර්ථික සම්පතක් පමණක් නොව, එය අනන්‍යතාවය, මතකය සහ සමාජ සංවිධානයේ පදනම ද වේ. දිත්වා සුළි කුණාටුවෙන් පීඩාවට පත් බොහෝ ගම්මාන රජ කාලයේ සිට පැවත එන ඒවා වන අතර, පරම්පරා ගණනාවක් තිස්සේ මිනිසුන් එකම භූමියක ජීවත් වෙමින්, වගා කරමින්, වන්දනාමාන කරමින් සහ මියගිය පසු මිහිදන් වෙමින් එම භූමිය සමඟ බැඳී සිටියහ.

අධික වර්ෂාව හේතුවෙන් ඇති වූ නායයෑම් මෙම බැඳීම් බිඳ දමා ඇත. දෙහඳු කඩුල්ල (කොත්මලේ කඩදොර ලෙසද හැඳින්වෙන) වැනි සංස්කෘතිකමය වශයෙන් වැදගත් සහ පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් ස්ථාන අවට භූමියේ ඉරිතැලීම් සහ පිපිරීම් ඇති වී ඇති බව ප්‍රදේශවාසීන් වාර්තා කරයි. මෙවැනි ස්ථානවලට සිදුවන හානිය හෝ ඒවා අහිමි වීම මගින් පොදු ඉතිහාසය, සංස්කෘතික අඛණ්ඩතාව සහ සාමූහික මතකය දියවී යන අතර, එය ආර්ථිකමය වශයෙන් මැනිය නොහැකි, ආපසු හැරවිය නොහැකි අලාභයකි.

ජෛව විවිධත්වය සහ පරිසර පද්ධති අහිමි වීම

දිත්වා සුළි කුණාටුව වනාන්තර විනාශය, පාංශු ඛාදනය, ගංගා ඉවුරු කඩා වැටීම සහ ජෛව විවිධත්වය අහිමි වීම ඇතුළු පුළුල් පාරිසරික හානියක් සිදු කළේය. නායයෑම් හේතුවෙන් කඳු බෑවුම්වල වෘක්ෂලතාදිය විනාශ වී, ජල පෝෂක ප්‍රදේශ අස්ථාවර වූ අතර ස්වභාවික ජලාපවහන පද්ධති වෙනස් විය. මෙය අනාගතයේදී ආපදා ඇතිවීමේ අවදානම තවත් වැඩි කරයි. මෙම පාරිසරික බලපෑම් ජල නියාමනය, ආහාර සුරක්ෂිතතාව සහ දිගුකාලීන ඔරොත්තු දීමේ හැකියාව සඳහා අත්‍යවශ්‍ය වන පරිසර පද්ධති සේවාවන් අඩපණ කරන නමුත්, ප්‍රතිසාධන මූල්‍යකරණයේදී (recovery finance) ඒවා සැලකිල්ලට ගනු ලබන්නේ කලාතුරකිනි.

මූල්‍ය ප්‍රතිපාදන, වගවීම සහ ප්‍රතිචාර දැක්වීමේ පවතින අඩුපාඩු

රජය විසින් හදිසි සහන සේවා, ඉවත් කිරීම් සහ සීමිත වන්දි ලබාදීමේ ක්‍රියාමාර්ග ගෙන තිබුණද, වත්මන් ප්‍රතිචාර මූලික වශයෙන් අවධානය යොමු කර ඇත්තේ කෙටි කාලීන මානුෂීය ආධාර සහ යටිතල පහසුකම් අලුත්වැඩියා කිරීම කෙරෙහි පමණි. දේශගුණික මූල්‍ය සැලසුම්කරණයේදී රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් සහ වෙළඳපල පදනම් කරගත් යාන්ත්‍රණයන් ප්‍රමුඛ වී ඇති අතර, හානි සහ විනාශයන් (Loss and Damage) වෙනුවෙන් වන්දි ගෙවීම, විශේෂයෙන්ම ආර්ථික නොවන හානි (NELD) සම්බන්ධයෙන් පවතින්නේ ඉතා අවම මට්ටමකය. ආර්ථික නොවන හානි තක්සේරු කිරීමට, ලේඛනගත කිරීමට හෝ ඒ සඳහා වන්දි ලබා දීමට කැපවූ ජාතික මට්ටමේ යාන්ත්‍රණයක් මෙතෙක් ස්ථාපිත කර නොමැත.

මානසික සෞඛ්‍ය සහය, අධ්‍යාපනය යථා තත්ත්වයට පත් කිරීම, සංස්කෘතික උරුමයන් ආරක්ෂා කිරීම සහ ප්‍රජා මූලික දිගුකාලීන නැවත පදිංචි කිරීම් වැනි අංශ සඳහා ප්‍රතිපාදන ලැබෙන්නේ ඉතා අඩුවෙන් වන අතර ඒවා විසිරුණු ස්වභාවයක් ගනී. තවද, පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති රඳා පවතින්නේ ප්‍රජාවන්ට තත්‍ය කාලීනව මැනිය නොහැකි වර්ෂාපතන සීමාවන් මතය. මෙයින් පැහැදිලි වන්නේ ප්‍රතිපත්ති සැලසුම් කිරීම සහ භූමියේ පවතින සැබෑ තත්ත්වය අතර පවතින පරස්පරතාවයි.

මීට අමතරව, දූෂකයා ගෙවිය යුතුය (Polluter Pays Principle) යන මූලධර්මය යටතේ, හරිතාගාර වායු විමෝචනයට වැඩිම වගකිවයුත්තන් හානි සහ විනාශයන් සඳහා මූල්‍යමය වශයෙන් සහය වීමට බැඳී සිටී. ගෝලීය විමෝචනයෙන් 0.1% කටත් වඩා අඩුවෙන් දායක වන ශ්‍රී ලංකාව, සමානුපාතික නොවන අන්දමේ දැවැන්ත හානියකට ගොදුරු වෙමින් පවතී. එසේ වුවද, හානි සහ විනාශයන් සඳහා වන මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන අතර, ඒවා ලබා ගැනීම දුෂ්කරය. එමෙන්ම එම ප්‍රතිපාදන පොසිල ඉන්ධන සමාගම්වල සහ ඉහළ විමෝචනයක් සහිත රටවල වගවීම සමඟ සම්බන්ධ වී නොමැත.

දිත්වා සුළි කුණාටුව මගින් පෙන්නුම් කරන්නේ 'හානි සහ විනාශයන්' යනු හුදෙක් වියුක්ත ප්‍රතිපත්ති සංකල්පයක් නොවන බවයි. එය විසඳාගත නොහැකි ශෝකය, බිඳී ගිය ප්‍රජාවන්, අහිමි වූ අනාගතය සහ මිනිසා සහ පරිසරය අතර පළුදු වූ සබඳතා හරහා දිනපතා අත්විඳින යථාර්ථයකි. දේශගුණික විපර්යාසවලට බලපාන සාධක පිළිබඳ පැහැදිලි පිළිගැනීමක් සහ අර්ථවත් වගවීමක් නොමැතිව සිදු කරන බොහෝ ප්‍රකෘතිමත් කිරීමේ උත්සාහයන්, අසාධාරණයට විසඳුම් සෙවීම වෙනුවට එම අසාධාරණයම නැවත ඇති කිරීමේ අවදානමක් පවතී. සමස්ථ හානි සහ විනාශයන් පිළිබඳ රාමු ජාතික සැලසුම්කරණයට ඇතුළත් කිරීමේ, කැපවූ සහ ප්‍රවේශ විය හැකි මූල්‍ය ප්‍රතිපාදන සුරක්ෂිත කිරීමේ සහ තීරණ ගැනීමේ ක්‍රියාවලීන්හිදී බලපෑමට ලක් වූ ප්‍රජාවන් අයිතිවාසිකම් හිමිකරුවන් ලෙස මධ්‍යගත කිරීමේ හදිසි අවශ්‍යතාවය මෙයින් අවධාරණය කෙරේ.



කඳුකරයේ නිවහන්වල සිට ගෝලීය අධ්‍යක්ෂ මණ්ඩල ශාලා දක්වා: දේශගුණික හානි සහ විනාශයන් වෙනුවෙන් පරිසර දූෂකයන් වන්දි ගෙවිය යුත්තේ ඇයි?

දිත්වා සුළි කුණාටුව හේතුවෙන් සිදු වූ විනාශය සහ අලාභහානි පිළිබඳ තොරතුරු වාර්තා කිරීම සඳහා ග්‍රීන්පීස් දකුණු ආසියානු (Greenpeace South Asia) කණ්ඩායමක් සහ මාධ්‍යවේදීන් පිරිසක් ජනවාරි 7-9 යන දිනවල කොත්මලේ, රාගල සහ වලපනේ යන ප්‍රදේශවල සංචාරය කළහ.

දිත්වා සුළි කුණාටුව බලපෑවේ ඉහළ කාබන් විමෝචනයක් සහිත කාර්මික ආර්ථිකයක් ඇති රටකට නොවේ. එයින් විනාශයට පත් වූයේ ශ්‍රී ලංකාවේ මධ්‍යම කඳුකරයේ වෙසෙන, දේශගුණික අර්බුදයට කිසිදු දායකත්වයක් ලබා නොදුන්, ස්වයංපෝෂිත සහ අඩු ආදායම්ලාභී ග්‍රාමීය ප්‍රජාවන්ය. එහෙත්, අද එහි දරුණුතම වන්දිය ගෙවමින් සිටින්නේ එම ජනතාවයි. නයපාන, මාවතුර, වලපනේ, රාගල සහ අවට ගම්මානවලින් වාර්තා වූ තොරතුරු අනුව පෙනී යන්නේ, දිත්වා සුළි කුණාටුව යනු හුදෙක් ආර්ථිකමය ව්‍යසනයක් පමණක් නොව, එය මැනිය නොහැකි ආර්ථික නොවන අලාභහානි (Non-economic loss and damage) සිදු කළ බරපතල සිදුවීමක් බවයි.

විනාශ වූ නිවාස, වගාවන් සහ ජීවනෝපායන්ට එහා ගිය ගැඹුරු මානසික පීඩනයක්, ගෞරවය අහිමි වීමක් මෙන්ම සංස්කෘතික හා සමාජීය ඒකාබද්ධතාවයේ බිඳ වැටීමක් මෙම ප්‍රජාවන් අත්විඳිමින් සිටිති. දරුවන් පසුවන්නේ දැඩි බියකිනි; සුළු වැස්සකදී පවා පාසල් යාමට ඔවුහු බිය වෙති. තම අනාගතය තීරණය කරන විභාගවලට පෙනී සිටීමට සූදානම් වන සිසුන් අවතැන් වීම නිසා මානසිකව ඇද වැටී ඇත. දෙමාපියන්ට සිදු වී ඇත්තේ දරුවන්ගේ ආරක්ෂාව සහ අධ්‍යාපනය අතරින් එකක් තෝරා ගැනීමටයි. යටිතල පහසුකම්, විදුලිය සහ සන්නිවේදන පහසුකම් නොමැතිකම හේතුවෙන් වැඩිහිටියන් සහ ආබාධිත පුද්ගලයින් ඉවත් කිරීමේදී ජීවිත අවදානමට ලක්වන මට්ටමේ අභියෝගවලට මුහුණ දී ඇත. මේවා තාවකාලික බලපෑම් නොවේ - මේවා මිනිසුන්ගේ ජීවිත, අනාගතය සහ අනන්‍යතාවය සහමුලින්ම වෙනස් කර දමන බලපෑම් වේ.

කලක් ස්වයංපෝෂිතව තිබූ මුළු ගම්මානම අද විසිරී ගොස් ඇත. අවතැන් වීමත් සමඟ පවුල් ආරවුල්, අනාරක්ෂිත බව, සොරකම් සහ පෞද්ගලිකත්වය හෝ ගෞරවය නොමැති සහන කඳවුරුවල දීර්ඝ කාලයක් රැඳී සිටීමට සිදු වීම නිසා සමාජ විශ්වාසය පළුදු වෙමින් පවතී. විහාරස්ථාන, පාසල් සහ පොදු ස්ථාන අධ්‍යාපනය හෝ ආගමික කටයුතු වෙනුවට අවතැන් කඳවුරු බවට පත්වීම නිසා සංස්කෘතික හා ආධ්‍යාත්මික ජීවිතය අඩාල වී ඇත. හුරුපුරුදු වටපිටාව, ජෛව විවිධත්වය සහ ස්ථාවර භූමිය අහිමි වීම මිනිසුන්ගේ මානසික සුවයට දැඩි ලෙස බලපා ඇත.

කොත්මලේ සහ වලපනේ ප්‍රදේශවාසීන් තම අතීත මතකයන් ගැන පවසන්නේ මෙවැනි අදහසකඃ අපි පොඩි කාලේ දවස් 14-15 දිගටම වැස්සා. හැබැයි කවදාවත් මේ වගේ දෙයක් වුණේ නැහැ.

නයපාන ගම්මානයේ, නොවැම්බර් 27 වනදා රාත්‍රියේ වර්ෂාව දැඩි වූ අතර, පසුදා අලුයම 3:00 ට පමණ ඉහළ බෑවුම්වලින් නායයෑම් ආරම්භ විය. විනාඩි 30ක් ඇතුළත නිවාස රැසක් විනාශ විය. "අපිට මොකක් හරි වැරැද්දක් වෙනවා කියලා තේරුණා. අපිට තිබුණේ විනාඩි කිහිපයයි. ඊට පස්සේ හැමදේම ඉවරයි. අපේ ගේ, බඩුමුට්ටු, හැමදේම නැති වුණා," යැයි නයපාන ගම්මානයේ මවක් වන දනසිල මැනිකේ පවසන්නීය.

විදුලිය විසන්ධි විය. දුරකථන සංඥා නැති විය. මාර්ග පද්ධතිය කඩා වැටුණි. වැඩිහිටියන් සහ ආබාධිතයන් සිටින පවුල්වලට ඉවත් වීමට කිසිදු ආරක්ෂිත මාර්ගයක් ඉතිරි නොවීය. වර්ෂාපතනය මිලිමීටර් 75-100 දක්වා වැඩි වුවහොත් ඉවත් වන ලෙස රජය උපදෙස් දී තිබුණද, ගම්වැසියන් විමසන්නේඃ "විදුලිය නැති, සංඥා නැති, කිසිම උපකරණයක් නැති රෑ දෙගොඩහරි ජාමේ අපි කොහොමද වර්ෂාපතනය මැන ගන්නේ?" කියාය.

ප්‍රතිපත්ති සහ බිම් මට්ටමේ පවතින යථාර්ථය අතර ඇති මෙම පරතරය නිසා, පූර්ව අනතුරු ඇඟවීම් ප්‍රයෝජනයට ගත නොහැකි උපදෙස් බවට පත්වී ජන ජීවිත අනතුරේ හෙළා ඇත.

මෙම බලපෑම් අහඹු ලෙස සිදු වූ ඒවා නොවේ. ප්‍රාදේශීය වැරදි කළමනාකරණය, අවිධිමත් ඉදිකිරීම්, වනාන්තර විනාශය සහ කාණු පද්ධති අවහිර වීම වැනි කරුණු මෙම අවදානම වැඩි කර ඇති අතර, මෙතරම් මහා පරිමාණ නායයෑම් ඇති කිරීමට හේතු වූ වර්ෂාපතනයේ තීව්‍රතාවය දේශගුණික විපර්යාසවල ප්‍රතිඵලයකි. අද පවතින වෙනස වන්නේ, මෙම ගම්මානවලින් බොහෝ ඈත සිටින මහා පරිමාණ සමාගම් සහ දියුණු රටවල් විසින් ෆොසිල ඉන්ධන නිස්සාරණය, නිෂ්පාදනය සහ පරිභෝජනය හරහා වායුගෝලයට මුදාහරින හරිතාගාර වායු නිසා වෙනස් වී ඇති දරුණු වර්ෂාපතන රටාවයි.

අන්ත අසරණ තත්ත්වයට වැටුණු දනසිල මැනිකේගේ පවුල

කඩා වැටුණු එක් නිවසකට පිටුපසින් සිව් දෙනෙකුගෙන් යුත් පවුලක් ජීවත් විය. කොඳු ඇට පෙළේ ආබාධයක් හේතුවෙන් උකුලෙන් පහළ පණ නැති වූ පියෙකු, පවුලේ එකම ආදායම් උපයන්නිය වූ මවක සහ සිය උසස් පෙළ විභාගයට සූදානම් වෙමින් සිටි 19 හැවිරිදි දියණියක වන නිමේෂා සෙව්වන්දි එහි වාසය කළහ. ඇයගේ සහෝදරයා යුද හමුදාවේ සේවය කරයි. ඔවුන්ට බේරාගත හැකි වූයේ වැදගත් ලේඛන කිහිපයක් සහ පාසල් පොත් කිහිපයක් පමණි. "අපිට අපේ ඇඳුම් ටිකවත් ගන්න ලැබුණේ නැහැ. මුළු ගේම පස්වලට යට වුණා," යැයි නිමේෂා සෙව්වන්දි දැඩි ශෝකයෙන් පැවසුවාය.

රජය විසින් කුලී ආධාර ලෙස රුපියල් 25,000ක මුදලක් ලබා දුන්නද, එය දීර්ඝකාලීන අවතැන්වීම්, වෛද්‍ය අවශ්‍යතා සහ අහිමි වූ ජීවනෝපායන් හමුවේ කිසිසේත්ම ප්‍රමාණවත් නොවේ. සිය අවසාන විභාගය වෙනුවෙන් ඉතා කැපවීමෙන් අධ්‍යයන කාලසටහන් සකස් කර තිබූ නිමේෂා පැවසුවේ, "මේ සිද්ධියෙන් පස්සේ කිසිම දෙයක් ගැන නිශ්චිත හැඟීමක් නැහැ. මම මගේ පාඩම් සටහන් සහ ප්‍රස්ථාර සියල්ල ඉවත් කරද්දී මට ඇඬුණා," යනුවෙනි.

මෙය දේශගුණික විපර්යාස නිසා සිදුවන හානිය මානුෂීය ලෙස අර්ථකථනය කිරීමකිඃ එනම් අනතුරේ වැටුණු අධ්‍යාපනික අනාගතය, බිඳ වැටුණු මානසික සෞඛ්‍යය, උදුරා ගත් ගෞරවය මෙන්ම අනාරක්ෂිතභාවය සහ සමාජ ජීවිතය අහිමි වීමයි.

ප්‍රජා සහයෝගීතාව සහ පද්ධතිමය අසාර්ථකත්වය

දේශගුණික විපර්යාස නිසා ඇති වූ අධික වර්ෂාපතනය මෙම ආපදාවට මුල පිරුවද, මිනිසා විසින් ගනු ලැබූ තීරණ එහි බලපෑම තීව්‍ර කිරීමට හේතු විය. නුවරඑළිය, මාවතුර ගම්වැසියන් පෙන්වා දෙන්නේ සැලසුම් රහිත වතු නිවාස සහ අපද්‍රව්‍ය බැහැර කිරීමේ පද්ධති හේතුවෙන් කඳු බෑවුම් දුර්වල වී ඇති බවයි. තේ වතු එළිපෙහෙළි කිරීමේදී පඳුරු මුලින්ම උදුරා දැමීමත්, කෘමිනාශක සහ වල්නාශක අධික ලෙස භාවිත කිරීමත් නිසා පසෙහි ස්ථායීතාව පිරිහී ඇති අතර, මාර්ග සංවර්ධනය හේතුවෙන් ස්වාභාවික ජලාපවහන මාර්ග අවහිර වී ඇති බවද ඔවුහු පෙන්වා දෙති.

මීට අමතරව, කොන්ක්‍රීට් යටිතල පහසුකම් හේතුවෙන් මතුපිට ජල ගලායාම වේගවත් වී ඇත. කඳු මුදුන්වල මහා පරිමාණ කාර්මික ගොවිතැන සහ නායයෑම් කලාප ලෙස හඳුනාගෙන ඇති ප්‍රදේශවල ඉදිකිරීම් සඳහා අවසර ලබාදීම ද බරපතල ගැටලු ලෙස හඳුනාගෙන ඇත. දේශගුණික බලපෑම්වලට ලක්වන කලාප පුරා දක්නට ලැබෙන පොදු ලක්ෂණයක් මෙයින් පිළිබිඹු වේඃ එනම්, දේශගුණික විපර්යාසයන්හි අන්තගාමී තත්ත්වයන් සහ දුර්වල පාලනය (Governance) එකිනෙක මුණගැසුණු විට, ව්‍යසනයන් කිහිප ගුණයකින් වර්ධනය වේ.

විධිමත් පද්ධතීන් අසාර්ථක වූ මොහොතේ, ගම්වැසියන් විසින්ම මුදාගැනීමේ මෙහෙයුම් සංවිධානය කිරීම කැපී පෙනෙන කරුණකි. එහිදී තරුණ කණ්ඩායම් හදිසි ආධාර සම්බන්ධීකරණය කළ අතර, පන්සල් සහ පාසල් සහන මධ්‍යස්ථාන බවට පත් විය. පවුල් අතර ආහාර, ඇඳුම් පැළඳුම් සහ නවාතැන් බෙදාහදා ගන්නා ලදී. කෙසේ වෙතත්, එවැනි සහයෝගීතාවයකට ද සීමාවන් පැවතිණි. ප්‍රධාන පුවත් සිරස්තලවලින් මෙම සිදුවීම බැහැර වී බොහෝ කලක් ගතවන තුරුත් හුදකලාව, කුසගින්න සහ බිය දිගටම පැවතිණි.
"සහනාධාර ලැබුණේ එළියට පෙනෙන අයුරින් හානි වූ නිවෙස්වලට පමණයි. නිවෙස් තුළ සිරවී සිටි අප වැනි අයව අමතක කර දැමුවා," යැයි චන්ද්‍රිකා දමයන්ති මහත්මිය පැවසුවාය.

දේශගුණික අර්බුදයේ බර කරට ගත් දරුවෝ

කොත්මලේ නයපාන විද්‍යාලයේ සිසුන් 640ක් අධ්‍යාපනය ලබති. එහි විදුහල්පති කේ.එම්.කේ.ජී. උපාලි හෙන්නායක මහතාට අනුව, මෙම ආපදාවෙන් එක් ගුරුවරයෙකු මියගිය අතර, පාසල් දරුවන් කිහිප දෙනෙකුගේම පවුල්වලට නිවාස අහිමි විය. දැන් සුළු වර්ෂාවකදී පවා දරුවන් පාසල් පැමිණීම නතර වී ඇත. බිය දැන් ඔවුන්ගේ සාමාන්‍ය ජීවිතයේ කොටසක් බවට පත්ව ඇත. හැකියාවක් ඇති ගම්වැසියන් බොහෝ දෙනෙකු නගර කරා සංක්‍රමණය වී ඇති අතර, එය සමස්ත ගමේ සංස්කෘතියට මෙන්ම පාසලටද දැඩි ලෙස බලපා ඇත.

"පොඩි වැස්සක් වැටුණත් දරුවන් ගොඩක් පාසල් එන්නේ නැහැ. බිය කියන දේ දැන් මෙහේ දෛනික යථාර්ථයක් වෙලා," යැයි විදුහල්පතිවරයා පැවසීය.
දේශගුණික අර්බුදයට වගකිව යුතු නොවන පරම්පරාවක්, දැන් එහි මානසික සහ අධ්‍යාපනික බර කරට ගෙන සිටිති. මෙය දිගුකාලීනව රටේ ආර්ථිකයට, සංස්කෘතියට සහ සමාජයට අහිතකර ලෙස බලපානු ඇත.

වන්දි ගෙවිය යුත්තේ කවුරුන්ද?

ඉහත සඳහන් කළ පරිදි, ශ්‍රී ලංකාව ගෝලීය කාබන්ඩයොක්සයිඩ් (CO_2) විමෝචනය සඳහා දායක වන්නේ 0.1% කටත් වඩා අඩුවෙන් වුවද, නයාපාන වැනි ප්‍රජාවන් ආපසු හැරවිය නොහැකි ආර්ථික සහ ආර්ථික නොවන පාඩු විඳිති. ප්‍රධාන පොසිල ඉන්ධන සමාගම් දිගින් දිගටම ලාභ ලබන අතර, අධික ලෙස වායු විමෝචනය කරන රටවල් අර්ථවත් 'දේශගුණික මූල්‍ය' (Climate Finance) සැපයීම ප්‍රහේලිකාවක්ව පවතින ලෝකයක මෙය සිදු වේ. ව්‍යසනයන් සඳහා දායක නොවන පිරිස් ඉන් පීඩා විඳින අතර, 'අලාභ හා හානි' (Loss and Damage) යාන්ත්‍රණයන් තවමත් ප්‍රමාණවත් අරමුදල් නොමැති, සාමාන්‍ය ජනතාවට ළඟා විය නොහැකි මට්ටමක පවතී.

විද්‍යාත්මක විශ්ලේෂණවලට අනුව, ගෝලීය උණුසුම ඉහළ යාම නිසා නිවර්තන කුණාටු සහ අධික වර්ෂාපතන තත්ත්වයන් තීව්‍ර වේ. සාගර උණුසුම් වීම නිසා වායුගෝලයේ තෙතමනය සන්තෘප්ත වීම (Moisture saturation), සුළි කුණාටු මගින් සාමාන්‍යයට වඩා වැඩි වර්ෂාපතනයක් රැගෙන ඒමට හේතු වන අතර, එමගින් දරුණු ගංවතුර සහ නායයෑම් ඇතිවීමේ සම්භාවිතාව ඉහළ නංවයි.

ජාත්‍යන්තර දේශගුණ විද්‍යා රාමු යටතේ, මෙවැනි බලපෑම් දේශගුණික විපර්යාස නිසා සිදුවන 'අලාභ හා හානි' ලෙස පිළිගැනේ.
ඒවාට ඇතුළත් වන්නේ:

- හදිසියේ ඇතිවන සිදුවීම්: සුළි කුණාටු, ගංවතුර, නායයෑම්.
- ආර්ථික අලාභ: විනාශ වූ යටිතල පහසුකම්, ජීවනෝපාය අහිමි වීම, නිවාස හානි.
- ආර්ථික නොවන අලාභ: මනෝවිද්‍යාත්මක කම්පනය, සංස්කෘතික උරුමයන් අහිමි වීම, මිනිසුන් අවතැන් වීම.

"දූෂකයා ගෙවිය යුතුය" යන මූලධර්මය (Polluters Pay Principle - PPP) අනුව, පරිසර දූෂණයට වගකිවයුතු ආයතන එහි පිරිවැය දැරිය යුතු අතර පීඩාවට පත් ප්‍රජාවන්ට වන්දි ගෙවිය යුතුය. දේශගුණික සාකච්ඡාවලදී මෙහි අර්ථය වන්නේ:

- පොසිල ඉන්ධන සමාගම් සහ අධික විමෝචනය කරන රටවල් 'අලාභ හා හානි' අරමුදල් සඳහා මූල්‍යමය වශයෙන් දායක විය යුතුය.
- වන්දි ගෙවීම් තීරණය කළ යුත්තේ, දිත්වා වැනි සුළි කුණාටු පිටුපස ඇති උණුසුම් වීමේ ප්‍රවණතාවන්ට හේතු වූ හරිතාගාර වායු විමෝචනය පිළිබඳ ඓතිහාසික වගකීම මත පදනම්වය.
- 'අලාභ හා හානි' යනු පුණ්‍යාධාරයක් නොව, ආපසු හැරවිය නොහැකි හානියක් වෙනුවෙන් ගෙවන වන්දියක් ලෙස වටහා ගත යුතුය.

එක්සත් ජාතීන්ගේ දේශගුණික විපර්යාස පිළිබඳ රාමු සම්මුතිය (UNICEF) යටතේ, දේශගුණික සිදුවීම් සහ ක්‍රමයෙන් සිදුවන ක්‍රියාවලීන්ගෙන් සිදුවන හානිය 'අලාභ හා හානි' ගණයට ඇතුළත් වේ. දේශගුණික වගකීම සහ වන්දි ගෙවීම් පිළිබඳ දිගුකාලීන සාකච්ඡාවලදී 'දූෂකයා ගෙවිය යුතුය' යන මූලධර්මය කේන්ද්‍රීය වී ඇත.

මෙම සන්දර්භය තුළ, ශ්‍රී ලංකාවේ හිටපු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා සහ දේශගුණික ක්‍රියාකාරීන් තර්ක කරන්නේ, ගෝලීය විමෝචනය හේතුවෙන් පීඩාවට පත්වන සංවර්ධනය වෙමින් පවතින රටවලට කාර්මික රටවලින් සහ පොසිල ඉන්ධන සමාගම්වලින් වන්දි ලැබිය යුතු බවයි. මෙය 'දූෂකයා ගෙවිය යුතුය' යන මූලධර්මය සමඟ අනුකූල වේ.

Nature සඟරාවේ පළ වූ අධ්‍යයනයකට අනුව, ලොව ඉහළම පොසිල ඉන්ධන විමෝචකයින් පස්දෙනා වන " සෞදි අරාම්කෝ (සෞදි අරාබිය), ගැස්ප්‍රොම් (රුසියාව), ෂෙව්රොන් (ඇමරිකාව), එක්සොන් මොබිල් (ඇමරිකාව) සහ බීපී (බ්‍රිතාන්‍යය) " තාපය ආශ්‍රිත හානි සඳහා පමණක් ඩොලර් ට්‍රිලියන 9ක වගකීමක් දරයි. පරිසර දූෂකයන් විසින් දේශගුණික අනුකූලනය (Adaptation) සහ අවම කිරීම (Mitigation) සඳහා මෙන්ම, අලාභ හා හානි සඳහා වන්දි ගෙවීමට මූල්‍යමය දායකත්වය ලබා දිය යුතුය යන තර්කය මෙමගින් තවදුරටත් තහවුරු වේ.

යුක්තිය ඉටු කිරීමට නම් අවශ්‍ය වන්නේ කුමන පියවරද

කොත්මලේ වැනි ප්‍රජාවන් සඳහා 'දේශගුණික යුක්තිය' යනු දේශගුණික අර්බුදය නිර්මාණය කිරීමට දායක වන සමාගම්වලට එරෙහිව නීතිමය වගවීමක් ඇති කිරීමයි. එනම්:
- ඓතිහාසික වශයෙන් පරිසරය දූෂණය කිරීමට වගකිව යුතු පාර්ශවයන්ගෙන් වන්දි ලබා ගැනීම.

විපතට පත් ජනතාව වෙත 'අලාභ හා හානි' (Loss and Damage) සඳහා වූ විශේෂිත මූල්‍ය ප්‍රතිපාදන ළඟා වීම.
- දිගුකාලීන නැවත පදිංචි කිරීම් සහ ආරක්ෂිත සැලසුම් සකස් කිරීම.
- මානසික සෞඛ්‍ය සහ අධ්‍යාපනය නංවාලීම සඳහා සහය ලබා දීම.
- අවදානම් තත්ත්වයන් නැවත ඇතිවීම වැළැක්වීම සඳහා පාලන පද්ධති ප්‍රතිසංස්කරණය කිරීම.

නයපාන ගම්මානයේ පදිංචි දරුවන් දෙදෙනෙකුගේ මවක් මෙසේ පැවසුවාය: "අපි ඉල්ලන්නේ අනුකම්පාව නෙවෙයි. අපේ දරුවන්ට නිශ්චිත අනාගතයක් සහ ආරක්ෂාවක් ලැබෙන එකයි අපිට ඕන."

දිත්වා සුළි කුණාටුව යනු හුදෙකලා සිදුවීමක් නොවේ. එය ඉදිරියේදී සිදුවිය හැකි විපත් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමකි. ගෝලීය වශයෙන් වගවීමක් නොමැති වුවහොත්, වෙනත් රටවල ලාභය මත පදනම් වූ අදූරදර්ශී ප්‍රතිපත්ති නිසා සිදුවන හානිය තවදුරටත් විඳදරාගැනීමට දේශගුණික අවදානමට ලක්ව ඇති රටවලට සිදුවනු ඇත. සිදුවන සෑම නායයෑමක්ම, අහිමි වන සෑම නිවසක්ම සහ කම්පනයට පත් වන සෑම දරුවෙක්ම, පරිසරය දූෂණය කරන පාර්ශවයන් ඒ සඳහා වන්දි ගෙවිය යුතුය යන සදාචාරාත්මක සහ නීතිමය තර්කය තවදුරටත් ශක්තිමත් කරයි.

පර්යේෂණ සොයාගැනීම්

වෘක්ෂලතාදිය අහිමි වීම සහ නව ජල මූලාශ්‍ර ඇතිවීම: දිත්වා ව්‍යසනය සමඟ ඇති සම්බන්ධය

භූගෝලීය තොරතුරු පද්ධති (GIS) පාදක කරගත් අවකාශීය විශ්ලේෂණයන් මඟින් පෙන්නුම් කරන්නේ, විශේෂයෙන් කොත්මලේ වැනි ප්‍රදේශවල වෘක්ෂලතාදිය අහිමි වීම, මතුපිට ජලය එක්රැස් වීම සහ ව්‍යසන අවදානම ඉහළ යාම අතර පැහැදිලි සබඳතාවක් පවතින බවයි. චන්ද්‍රිකා මඟින් සිදුකළ නිරීක්ෂණවලට අනුව, ඉඩම් භාවිතය වෙනස් වීම, බෑවුම් වෙනස් කිරීම සහ ඉදිකිරීම් කටයුතු හේතුවෙන් කාලයත් සමඟ ශාක ප්‍රජාව සහ ඒවායේ ව්‍යාප්තිය කැපී පෙනෙන ලෙස අඩු වී ඇත.

බෑවුම් සහිත ප්‍රදේශවල වෘක්ෂලතාදිය අත්‍යවශ්‍ය කාර්යභාරයක් ඉටු කරයි. වනාන්තර විනාශය නිසා පස බැඳ තබා ගන්නා මුල් පද්ධතිය සහ පාංශු ව්‍යුහය දුර්වල වන අතර, එමඟින් ජලය පොළොවට උරා ගැනීමේ හැකියාව සහ පස රඳවා ගැනීමේ හැකියාව අඩු වේ. එහි ප්‍රතිඵලයක් ලෙස වර්ෂා ජලය මතුපිටින් ගලා ගොස් පාලනය කළ නොහැකි ලෙස පාංශු ඛාදනය ඇති කරයි.



සිතියම 01: ශ්‍රී ලංකාවේ කොත්මලේ ප්‍රදේශයේ වෘක්ෂලතා ආවරණයේ වෙනස්වීම් - 2016 සිට 2025 දක්වා (දිට්වා සුළි කුණාටුවට පෙර)

චන්ද්‍රිකා දත්ත විශ්ලේෂණයන්ට අනුව, වෘක්ෂලතා ආවරණය අහිමි වීම සහ කඳු බෑවුම් ආශ්‍රිත ව්‍යසන අතර ඉතා ඉහළ සහසම්බන්ධතාවක් පවතී Sentinel-2 L2 අධි-විභේදන චන්ද්‍රිකා රූප (High-resolution satellite imagery) භාවිත කරමින්, දිත්වා නායයෑමට පෙර සහ පසු වෘක්ෂලතා ආවරණයේ තත්ත්වය සාමාන්‍යකරණය කළ වෘක්ෂලතා දර්ශකය (NDVI) මඟින් මැන බලන ලදී. 2016 සිට 2025 දක්වා වෘක්ෂලතා ආවරණයේ වෙනස්වීම් මැන බැලූ (NDVI) සිතියමට අනුව, කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නැගෙනහිර කොටසේ ඉහළ වෘක්ෂලතා හානියක් දක්නට ලැබෙන අතර, එම ප්‍රදේශය නායයෑමේ රතු නිවේදන වැඩිම සංඛ්‍යාවක් නිකුත් වූ කලාපය ද වේ.



සිතියම 02■ දිට්වා ව්‍යසනයෙන් දරුණු ලෙස පීඩාවට පත් ග්‍රාම නිලධාරී වසම් සහ අදාළ ගම්මානවල සිදු වූ වෘක්ෂලතා හානියේ මට්ටම

වගුව 01: ශ්‍රී ලංකාවේ කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දරුණු ලෙස පීඩාවට පත් තෝරාගත් ගම්මාන කිහිපයක පිහිටීම සහ වෘක්ෂලතා හානියේ මට්ටම

ගම්මානයේ නම	අක්ෂාංශය (°N)	දේශාංශය (°E)	වෘක්ෂලතා හානියේ මට්ටම (2016-2025)
කොත්මලේ (මධ්‍යම ගම්මානය)	7.0142	80.5897	මධ්‍යස්ථ වෘක්ෂලතා හානියක්
සංගිලිපාලම (ප්‍රා.ලේ. කාර්යාල ප්‍රදේශය)	7.06464	80.68456	මධ්‍යස්ථ වෘක්ෂලතා හානියක්
කොත්මලේ නව නගරය	7.061	80.681	සුළු-මධ්‍යස්ථ වෘක්ෂලතා හානියක්
තවලන්තැන්න	7.062	80.692	මධ්‍යස්ථ වෘක්ෂලතා හානියක්
තවලන්තැන්න (ඉහළ ප්‍රදේශය)	7.076	80.684	දරුණු වෘක්ෂලතා හානියක්
මල්හේවා	7.05	80.68	සුළු වෘක්ෂලතා වර්ධනයක්
රම්බොඩ (ගම්මානය)	7.058	80.686	මධ්‍යස්ථ වෘක්ෂලතා හානියක්
නියංගන්දොර	7.055	80.675	මධ්‍යස්ථ වෘක්ෂලතා හානියක්
හරංගල	7.06	80.59	සුළු වෘක්ෂලතා හානියක්
උලපනේ	7.065	80.685	මධ්‍යස්ථ වෘක්ෂලතා හානියක්
යටිපියංගල	7.075	80.685	දරුණු වෘක්ෂලතා හානියක්

කොත්මලේ නැගෙනහිර කඳු පන්තිවල සහ ගංගා ද්‍රෝණියේ දක්නට ලැබෙන ශාක පද්ධතියේ ශීඝ්‍ර හායනය, පාරිසරික වෙනස්කම් හේතුවෙන් ආපදා තත්ත්වයන් දරුණු අතට හැරීම කෙරෙහි දැඩි අවධානයක් යොමු කරයි. ඉහළම ශාක ඝනත්වයක් ඇති ප්‍රදේශවල නායයෑම් වාර්තා වීම ඉතා අවම මට්ටමක පැවති අතර, ශාක පද්ධතිය ඉවත් කරන ලද ස්ථානවලින් බහුලවම දරුණු නායයෑම් වාර්තා විය.

ශ්‍රී ලංකාවේ ආපදා අවදානම අවම කිරීම සඳහා මෙම ප්‍රතිඵල වැදගත් පාඩම් රැසක් කියා දෙයි. පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති, ජලාපවහන ක්‍රම සහ බැම් ඉදිකිරීම වැනි සෘජු විසඳුම් වැදගත් වන අතරම, සෞඛ්‍ය සම්පන්න පරිසර පද්ධති සහ වෘක්ෂලතාවලින් ලැබෙන තීරණාත්මක ප්‍රතිලාභ කිසිසේත් අවම කළ නොහැක. කොත්මලේ වැනි සංවේදී කඳුකර ප්‍රදේශවල ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීම සඳහා නැවත වන වගාව සහ නිසි භූමි පරිහරණ කළමනාකරණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය වේ.

කොත්මලේ තාවකාලික සහ ස්ථිර ජල ව්‍යුහයන් නිර්මාණය වීම සහ වර්ධනය

සම්මත වෙනස් කළ දර්ශක ජල දර්ශකය Normalized Difference Water Index (NDWI) යනු හරිත හා අධෝරක්ත වර්ණාවලි කලාප සංසන්දනය කරමින් විවෘත ජල මූලාශ්‍ර හඳුනා ගැනීමට යොදාගන්නා දුරස්ථ සංවේදක දර්ශකයකි. ආපදාවට පෙර සහ පසු NDWI අගයන් සැසඳීමෙන්, දිත්වා (Ditwah) සුළි කුණාටුව ආශ්‍රිත අධික වර්ෂාව, බෑවුම් කඩා වැටීම් සහ ජලාපවහන මාර්ග වෙනස් වීම නිසා ඇති වූ ජලවිද්‍යාත්මක වෙනස්කම් මැනවින් හඳුනාගත හැක.



සිතියම 03: 2025 ඔක්තෝබර් (දිට්වා සුළි කුණාටුවට පෙර) සහ දෙසැම්බර් (දිට්වා සුළි කුණාටුවට පසු) මතුපිට ජල ව්‍යාප්ති රටාවන්හි සංසන්දනය.



සිතියම 04: දිට්වා සුළි කුණාටුව හේතුවෙන් කොත්මලේ ප්‍රදේශයේ මතුපිට ජල ව්‍යාප්තියේ සිදු වූ වෙනස්කම්.

- නිල් පැහැති ප්‍රදේශ: නව ජල කඳන් හෝ දරුණු ගංවතුර කලාප නිරූපණය කරයි.
- ලා නිල් පැහැති ප්‍රදේශ: මධ්‍යස්ථ මට්ටමේ ගංවතුර සහ කුඩා දිය පහරවල් නිර්මාණය වීම පෙන්වයි.
- දුඹුරු පැහැති ප්‍රදේශ: ජලය බැසයාම, රොන්මඩ තැන්පත් වීම හෝ ජල මාර්ග වෙනස් වීම නිසා ජල ප්‍රමාණය අඩු වූ ප්‍රදේශ පෙන්වයි.

මෙලෙස අලුතින් නිර්මාණය වූ ජල කඳන්, දුර්වල ජලාපවහනය සහ පස ජලයෙන් සංතෘප්ත වීමේ ලක්ෂණ වේ. කාලයත් සමඟ පසෙහි තෙතමනය රඳා පැවතීම බෑවුම් අස්ථාවර වීමට විශාල වශයෙන් බලපායි.
මෑතකදී නිර්මාණය වූ මෙම ජලාශ්‍රිත ප්‍රදේශ, දුර්වල ජලාපවහනය, පස ජලයෙන් සංතෘප්ත වීම සහ වෙනස් වූ ජල විද්‍යාත්මක රටාවන්හි රෝග ලක්ෂණ වේ. එබැවින්, කාලයත් සමඟ පසෙහි තෙතමනය රඳවා තබා ගැනීම බෑවුම්වල අස්ථාවරත්වයට බෙහෙවින් දායක විය හැකිය.

දිත්වා සුළි කුණාටුවට පෙර සිටම, භූමියේ අසාමාන්‍ය ලෙස ඉහළ තෙතමනයක් පවතින බව නිරීක්ෂණය වී තිබුණි. මෙයින් පෙන්නුම් කරන්නේ ජලයෙන් සංතෘප්ත වූ පසෙහි ජල විද්‍යාත්මක උච්චතම අවස්ථාවකට (tipping point) එළඹ තිබූ බවයි. මෙය නායයෑම් සහ ගංවතුර සිදුවීම්වල පරිමාණය කෙරෙහි බලපෑවේය.

අවකාශීය රටාවන්ට අනුව පෙනී යන්නේ, අලුතින් බිහි වූ ජල මූලාශ්‍ර ප්‍රධාන වශයෙන් කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පවතින ගංගා මාර්ග, නිම්න පත්ල සහ පහත් බිම් ආශ්‍රිතව සංකේන්ද්‍රණය වී ඇති බවයි. මෙමගින් පෙන්නුම් කරන්නේ ආපදාව හේතුවෙන් මතුපිට ජල ගලායාම තීව්‍ර වී ඇති අතර, ගංගා ජාලයන් ව්‍යාප්ත වී කෘෂිකාර්මික ඉඩම් සහ ජනාවාස තාවකාලිකව ජලයෙන් යටවූ කලාප බවට පත්ව ඇති බවයි. පාරිසරික දෘෂ්ටිකෝණයකින් බලන කල, මෙම වෙනස්කම්වල ධනාත්මක මෙන්ම ඍණාත්මක බලපෑම් ද පැවතිය හැකිය. දිගුකාලීන ගංවතුර තත්ත්වයන් පාංශු ඛාදනය, පෝෂක ද්‍රව්‍ය අහිමි වීම සහ අවසාදිත තැන්පත්වීම වැඩි කරන අතර, එමගින් පහළ ගංගා පෝෂිත ජලාශ සහ ජලජ පරිසර පද්ධති පිරිහීමට ලක් විය හැකිය. අනෙක් අතට, නිසි ලෙස කළමනාකරණය කරන්නේ නම්, අලුතින් නිර්මාණය වූ තෙත් බිම් සහ ව්‍යාප්ත වූ ජල පෘෂ්ඨයන් භූගත ජල මට්ටම ඉහළ නැංවීමටත්, ජෛව විවිධත්වයට සහය වීමටත්, ජලජ ජීවීන්ට තාවකාලික වාසස්ථාන සැපයීමටත් දායක විය හැකිය.

සමාජීය බලපෑම වඩාත් ක්ෂණික සහ දෘශ්‍යමාන වේ. අලුතින් ජලයෙන් යට වූ ප්‍රදේශ බොහෝ විට වගාබිම්, ප්‍රවේශ මාර්ග සහ නේවාසික කලාප සමඟ අතිච්ඡාදනය වන අතර, එමගින් ජීවනෝපාය බිඳවැටීම, බෝග හානි සහ දියරමය රෝග වැනි සෞඛ්‍ය අවදානම් වැඩි කරයි. අලුතින් බිහි වූ දිය පහරවල් හෝ ගංවතුර කලාප අසල පදිංචි ප්‍රජාවන්, අධික වර්ෂාපතනයක් ඇති වූ විට නැවත නැවතත් එවැනිම උපද්‍රවයන්ට මුහුණ දීමේ අවදානමක් පවතී. කෙසේ වෙතත්, ස්ථාවර 'වෙනසක් නොමැති' ප්‍රදේශ හඳුනා ගැනීම, ආරක්ෂිත ඉඩම් පරිහරණ සැලසුම්කරණය, නැවත පදිංචි කිරීමේ උපාය මාර්ග සහ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වටිනා තොරතුරු සපයයි.

එකතු කරන ලද අවකාශීය දත්ත මගින් අවධාරණය කරන්නේ, දිත්වා ආපදාව අධික වර්ෂාපතනයක ප්‍රතිඵලයක් වුවද, එහි බලපෑමේ පරිමාණය සඳහා පාරිසරික හායනය, විශේෂයෙන්ම වෘක්ෂලතාදිය විනාශ වීම සැලකිය යුතු ලෙස බලපෑ ඇති බවයි. ප්‍රාදේශීය පරිසර පද්ධති සේවාවන් කෙරෙහි ප්‍රවේශමෙන් අවධානය යොමු කිරීම සහ රැකබලා ගැනීමකින් තොරව, දේශගුණික විපර්යාස සහ අන්තගාමී කාලගුණික සිදුවීම් ප්‍රජාවන් කෙරෙහි වඩ වඩාත් දරුණු බලපෑම් ඇති කරනු ඇත.

විශේෂයෙන් වනාන්තර සංරක්ෂණය, බෑවුම් ප්‍රතිසංස්කරණය, විචක්ෂණශීලී ඉඩම් කළමනාකරණය සහ සංවේදී පරිසරයන්හි ඉඩම් පරිහරණය පාලනය කිරීම හරහා පරිසර පද්ධති පදනම් කරගත් ආපදා අවදානම් අවම කිරීම ශක්තිමත් කිරීමේ අවශ්‍යතාව මෙම විශ්ලේෂණය මගින් යෝජනා කරයි. එසේ කිරීමට අපොහොසත් වීම මෙවැනි ආපදාවල සම්භාවිතාව සහ වාර ගණන ඉහළ නැංවීමට හේතු විය හැක.

නිගමනය සහ නිර්දේශ

දිත්වා සුළි කුණාටුව විසින් දේශගුණික අසාධාරණයේ (Climate Injustice) ඇති බියකරු යථාර්ථය නිරාවරණය කර ඇත. ගෝලීය හරිතාගාර වායු විමෝචනය සඳහා ප්‍රායෝගිකව කිසිදු දායකත්වයක් ලබා නොදුන් ශ්‍රී ලංකාවේ මධ්‍යම කඳුකරයේ ප්‍රජාවන්, තමන් නිර්මාණය නොකළ දේශගුණික අර්බුදයක් හේතුවෙන් ආර්ථික මෙන්ම ආර්ථික නොවන අතිමහත් විනාශයකට මුහුණ දෙමින් සිටිති. මෙම ව්‍යසනය හේතුවෙන් ජීවිත 650 කට වඩා අහිමි වූ අතර, ලක්ෂ සංඛ්‍යාත පිරිසක් අවතැන් විය. නිවාස හා ජීවනෝපායන් විනාශ වූවා සේම මානසික සෞඛ්‍යය, සංස්කෘතික අඛණ්ඩතාව, අධ්‍යාපනය සහ සමාජ ඒකාබද්ධතාවයට ද ආපසු හැරවිය නොහැකි හානියක් සිදු විය. මෙම බලපෑම් හුදු මූල්‍ය වන්දි මගින් පමණක් පියවිය නොහැකි තරම් ගැඹුරුය.

මානව ක්‍රියාකාරකම් හේතුවෙන් සිදුවී ඇති දේශගුණික විපර්යාස නිසා, දිත්වා කුණාටුව හා සම්බන්ධ අධික වර්ෂාපතනයේ තීව්‍රතාවය ගෝලීය උණුසුම් වීමක් සිදු නොවූයේ නම් පැවතිය හැකි මට්ටමට වඩා 28% ත් 160% ත් අතර ප්‍රමාණයකින් වැඩි වී ඇති බව විද්‍යාත්මක සාක්ෂි සනාථ කරයි. මෙය හුදෙකලා සිදුවීමක් නොවේ. ප්‍රධාන වශයෙන් වායු විමෝචනය කරන රටවල් සහ ෆොසිල ඉන්ධන සමාගම් කිසිදු දඬුවමකින් තොරව තම කටයුතු කරගෙන යන අතරතුර, දේශගුණික වශයෙන් අවදානමට ලක්විය හැකි ජාතීන් අසමානුපාතික ලෙස පීඩා විඳීමේ නැගී එන රටාවක කොටසකි. දේශගුණික යුක්තිය පිළිබඳ මූලධර්ම සහ 'දූෂකයා ගෙවිය යුතුය' (Polluter Pays Principle) යන මූලධර්මය අනුව, මෙම අර්බුදයට වඩාත්ම වගකිව යුතු පාර්ශවයන් සිදුවී ඇති අලාභ හා හානි (Loss and Damage) සම්බන්ධයෙන් අර්ථවත් වගකීමක් දැරිය යුතුය.

එසේ වුවද, ශ්‍රී ලංකාව මේ වන විට ණය ප්‍රතිව්‍යුහගත කිරීම පිළිබඳව සලකා බලන විට, දිත්වා සුළි කුණාටුවේ විනාශකාරී බලපෑම් තීව්‍ර කළ සංවර්ධන ව්‍යාපෘතිවල පාරිසරික පිරිවැය මෙම ගණනය කිරීම්වලින් ගිලිහී ගොස් ඇත. ණය මත පදනම් වූ සංවර්ධන කටයුතු මගින් මධ්‍යම කඳුකරයේ ස්ථාවරත්වය ක්‍රමවත් ලෙස අඩපණ කර ඇත්තේ පහත සඳහන් ක්‍රියාකාරකම් මගින්:

- පස බැඳ තබා ගන්නා ශාක පද්ධති ඉවත් කිරීම.
- මතුපිට ජලය එක්රැස් වීම සහ නායයෑමේ අවදානම වැඩි කරන අයුරින් බෑවුම් මත ඉදිකිරීම් සිදු කිරීම.
- ස්වාභාවික ජල බැසයාම් අවහිර කරමින් සහ ජල ගලායාම වේගවත් කරමින් මාර්ග පද්ධති ඉදි කිරීම.
- ජල පෝෂක ප්‍රදේශ විනාශ කරමින් සහ පසේ ව්‍යුහය පිරිහීමට ලක් කරමින් සිදු කරන ලද කැණීම් හා ගල්කොරි කටයුතු.
- ජලය උරා ගන්නා වනාන්තර වෙනුවට ජලය නොබැස යන කොන්ක්‍රීට් හෝ තාර පෘෂ්ඨයන් ඇති කරමින් සිදු කළ සංවර්ධන රටාවන්.

මෙම මැදිහත්වීම් මගින් ව්‍යසනයන්ට ඇති අවදානම තීව්‍ර කරන ජල විද්‍යාත්මක හා පාරිසරික තත්ත්වයන් නිර්මාණය විය. එහි ප්‍රතිඵලයක් ලෙස පාලනය කරගත හැකිව තිබූ අධික වර්ෂාපතනයක් වුවද, මුළු ගම්මාන පිටින් යට කරන, මිනිත්තු කිහිපයකින් නිවාස විනාශ කරන සහ අවසාන කටයුතු සඳහා මියගිය තම ඥාතීන්ගේ සිරුරු පවා සොයා ගැනීමට නොහැකි වන මට්ටමේ දැවැන්ත නායයෑම් බවට පරිවර්තනය විය.

ප්‍රාදේශීය පරිසර පද්ධති විනාශ වීම ආපදා අවදානම තීව්‍ර කිරීමට හේතු වුවද, නායයෑම් සහ ගංවතුර ඇති කිරීමට බලපෑ වර්ෂාපතනයේ ප්‍රමාණය සහ තීව්‍රතාවය මගින් පෙන්නුම් කරන්නේ ගෝලීය පොසිල ඉන්ධන විමෝචනය හේතුවෙන් දේශගුණික රටාවන්හි සිදුවී ඇති පද්ධතිමය වෙනස්කම්ය. මෙම මූලික හේතූන් සඳහා විසඳුම් සෙවීමේදී දේශීය පරිසර පද්ධති ප්‍රතිෂ්ඨාපනය මෙන්ම ගෝලීය වගවීම ද අවශ්‍ය වේ. ණය මගින් මූල්‍යනය කරන ලද ව්‍යාපෘති හරහා සිදුවන පාරිසරික විනාශය පිළිබඳ වගවීම ද මෙයට ඇතුළත් විය යුතුය.

ජීවිත බේරාගැනීමේ ක්ෂණික ප්‍රතිචාර අතින් අගය කළ හැකි වුවද, මේ දක්වා ගෙන ඇති සහන පියවර ප්‍රමාණවත් නොවේ. පවතින පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති සැබෑ ලෝකයේ තත්ත්වයන් හමුවේ ප්‍රමාණවත් නොවන බව ඔප්පු වී ඇත. සහන සැලසීම කෙටි කාලීන වන අතර එය විසිරුණු ස්වභාවයක් ගනී. ප්‍රතිපත්ති රාමුවල ආර්ථික නොවන හානි (Non-economic losses) තවමත් අවධානයට ලක් නොවන මට්ටමක පවතී. වඩාත්ම තීරණාත්මක කරුණ වන්නේ, දූෂණය කරන්නන් විසින් සිදු කරන ලද හානිය වෙනුවෙන් ඔවුන්ගේ දායකත්වය ලබා ගැනීමට හෝ තමන් මූල්‍යනය කළ ව්‍යාපෘති මගින් සිදුවන පාරිසරික විනාශය සම්බන්ධයෙන් ණය හිමියන් වගකීමට බැඳ තැබීමට කිසිදු ක්‍රියාකාරී යාන්ත්‍රණයක් නොමැති වීමයි.

දිත්වා සුළි කුණාටුවෙන් පීඩාවට පත් ප්‍රජාවන් ඉල්ලා සිටින්නේ අනුකම්පාව නොවේ. ඔවුන් ඉල්ලා සිටින්නේ යුක්තිය, ස්ථාවරත්වය සහ තමන් නිර්මාණය නොකළ, වෙනස් වූ දේශගුණික තත්ත්වයන් සහිත ලෝකයක් තුළ ගෞරවාන්විතව තම ජීවිත නැවත ගොඩනගා ගැනීමට ඇති අයිතියයි.

නිර්දේශ

1. ආර්ථික නොවන හානි සහ විපත් (NELD) පිළිගන්නා ජාතික හානි සහ විපත් රාමුවක් ස්ථාපිත කිරීම

රජය විසින් ආර්ථික නොවන හානි සහ විපත් (NELD) පැහැදිලිවම පිළිගන්නා විස්තීර්ණ ජාතික හානි සහ විපත් රාමුවක් වහාම ස්ථාපිත කළ යුතුය. මෙය ජාතික දේශගුණික ප්‍රතිපත්ති, ආපදා ප්‍රතිසාධන සැලසුම් සහ වන්දි ගෙවීමේ යාන්ත්‍රණවලට විධිමත්ව ඇතුළත් කළ යුතුය. එහිදී විශේෂයෙන් කාන්තාවන් මත පැටවෙන ගෙවීම් නොලබන සත්කාරක සේවා බර (unpaid care burdens) පිළිගත යුතු අතර, ප්‍රතිචාරයන් මූල්‍ය වන්දිවලින් ඔබ්බට ගොස් දිගුකාලීන මනෝ-සමාජීය රැකවරණය, කම්පනය පිළිබඳ අවබෝධය සහිත අධ්‍යාපන ප්‍රතිසාධනය සහ සංස්කෘතික වශයෙන් උචිත සුවපත් කිරීමේ ක්‍රියාවලීන් දක්වා ව්‍යාප්ත විය යුතුය.

2. තීරණ ගැනීමේ බලය සහිත ස්වාධීන හානි සහ විපත් කමිටුවක් පිහිටුවීම

කාන්තාවන්, ගොවීන්, ධීවරයින්, වතු කම්කරුවන්, සුළු ව්‍යාපාරිකයන්, ආබාධිත පුද්ගලයින් සහ ආපදාවලින් දිවි ගලවා ගත් අය ඇතුළු පීඩාවට පත් ප්‍රජාවන්ගේ අර්ථවත් නියෝජනයක් සහිත ස්වාධීන හානි සහ විපත් කමිටුවක් පිහිටුවිය යුතුය. මෙම ආයතනය හුදු උපදේශන ආයතනයක් පමණක් නොව, හානි සහ විපත් තක්සේරු කිරීම්, වන්දි යාන්ත්‍රණ සහ ප්‍රතිසාධන වැඩසටහන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම සම්බන්ධයෙන් තීරණ ගැනීමේ බලය සහිත ආයතනයක් විය යුතුය.

3. අර්ථවත් ප්‍රජා සහභාගීත්වය සහ කාන්තා නායකත්වය සහතික කිරීම

පීඩාවට පත් ජනතාවට ඵලදායී ලෙස මැදිහත් වීමට හැකි වන පරිදි අඛණ්ඩ ධාරිතා වර්ධනයක්, මූල්‍ය සම්පත් සහ ආයතනික සහාය ලබා දෙමින් සැබෑ ප්‍රජා සහභාගීත්වය රජය විසින් සහතික කළ යුතුය. කාන්තා නායකත්වය සහ කොන් කරන ලද කණ්ඩායම් ඇතුළත් කර ගැනීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළ යුතු අතර, ප්‍රජා සාමාජිකයන් හුදු නාමික උපදේශනයකට පමණක් සීමා නොවී, තීරණාත්මක ප්‍රතිඵල හැඩගැස්වීමේ සක්‍රීය කොටස්කරුවන් බවට පත් කළ යුතුය.

4. දිගුකාලීන මනෝසාමාජීය සහාය සහ කම්පනය හඳුනාගත් ප්‍රතිසාධන ක්‍රියාවලියක් සැපයීම

ආපදාවලින් පීඩාවට පත් ජනතාව සඳහා කැපවූ, දිගුකාලීන මානසික සෞඛ්‍ය සහ මනෝසාමාජීය ආධාරක සේවා ස්ථාපනය කළ යුතුය. මෙහිදී අධ්‍යාපනය අහිමි වූ දරුවන්ට, අවතැන් වූ පවුල්වලට, තම පාරම්පරික ඉඩම් අහිමි වූ වැඩිහිටියන්ට සහ ආපසු හැරවිය නොහැකි සංස්කෘතික අලාභයන්ට මුහුණ දෙන ප්‍රජාවන්ට ප්‍රමුඛතාවය දිය යුතුය. ප්‍රතිසාධන ප්‍රයත්නයන් තුළ ශෝක කළමනාකරණ උපදේශනය, කම්පනය හඳුනාගත් අධ්‍යාපන ක්‍රම සහ සංස්කෘතිකමය වශයෙන් උචිත සුවපත් කිරීමේ ක්‍රියාවලීන් ඇතුළත් විය යුතුය.

5. ආපදා බලපෑමට ලක් වූ ප්‍රදේශවල ප්‍රජා මූලික මානසික සෞඛ්‍ය සේවා ව්‍යාප්ත කිරීම

අසමානුපාතික සත්කාරක බරක් දරන කාන්තාවන්, ඉවත් කිරීම් වලදී වැඩි අවදානමකට ලක්වන ආබාධිත පුද්ගලයින්, දීර්ඝ කාලීන පාසල් බාධා කිරීම්වලට ලක්වන දරුවන් සහ දිගුකාලීන අවතැන්වීම්වලට මුහුණ දෙන කුටුම්භ ඉලක්ක කරගනිමින්, ප්‍රවේශ විය හැකි ප්‍රජා මූලික මනෝසාමාජීය වැඩසටහන් රජය විසින් ක්‍රියාත්මක කළ යුතුය. මෙම සේවාවන් දේශීයව මුල් බැසගත් සහ කාලානුරූපව තිරසාරව පවත්වාගෙන යන ඒවා බවට සහතික විය යුතුය

6. දේශගුණික වගවීම සහ ගදූෂකයා ගෙවිය යුතුය (Polluter Pays) මූල්‍ය ක්‍රමය ඉල්ලා සිටීම

'දූෂකයා ගෙවිය යුතුය' යන මූලධර්මය ජාත්‍යන්තරව ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකාව සක්‍රීයව සහාය දිය යුතුය. ඒ හරහා සිදුවන හානි සහ අලාභ (Loss and Damage) වෙනුවෙන් මහා පරිමාණ තෙල් හා ගෑස් සමාගම් සහ අධික ලෙස හරිතාගාර වායු විමෝචනය කරන රටවල් නීතිමය හා මූල්‍යමය වශයෙන් වගකීමට බැඳ තැබිය යුතුය. විද්‍යාත්මක සාධක සහ ජාත්‍යන්තර නීතිය මත පදනම් වූ දේශගුණික වගකීම් හිමිකම්වලට රජය සහාය දිය යුතු අතර බැඳීම් සහිත වගවීමේ යාන්ත්‍රණයන් වෙනුවෙන් පෙනී සිටිය යුතුය.

7. නව ණය බරක් ඇති නොවන පරිදි ප්‍රදාන මත පදනම් වූ 'හානි සහ අලාභ' මූල්‍යකරණය සුරක්ෂිත කිරීම

එක්සත් ජාතීන්ගේ දේශගුණික විපර්යාස පිළිබඳ රාමුව (UNFCCC) යටතේ පැවැත්වෙන සාකච්ඡාවලදී, ආර්ථික නොවන හානි සහ අලාභ (NELD) ද ඇතුළත් වන පරිදි, කැපවූ සහ ප්‍රවේශ විය හැකි ප්‍රදාන මත පදනම් වූ මූල්‍ය පහසුකම් ශ්‍රී ලංකාව ඉල්ලා සිටිය යුතුය. තවද, මෙම අරමුදල් පීඩාවට පත් ප්‍රජාවන් වෙත සෘජුවම ලැබිය යුතු බවත්, ඒවා රටේ ණය බර තවදුරටත් දැඩි නොකළ යුතු බවත් අවධාරණය කළ යුතුය.

8. දේශගුණික විපර්යාස ආශ්‍රිත ණය අවලංගු කිරීම

දේශගුණික අවදානමට ලක්විය හැකි රටවල් සඳහා පුළුල් ණය අවලංගු කිරීමක් හෝ සාධාරණ ණය ප්‍රතිව්‍යුහගත කිරීමක් වෙනුවෙන් රජය පෙනී සිටිය යුතුය. වෙනත් පාර්ශවයන් විසින් සිදු කරන ලද දේශගුණික විනාශයන් හමුවේ රට නැවත ගොඩනඟන අතරතුර ණය වාරික ගෙවීමට සිදුවීම දැඩි අසාධාරණයකි. මෙම ණය සහන හරහා නිදහස් වන මූල්‍ය අවකාශය, රටේ ස්වෛරීභාවයට හානි නොවන පරිදි ප්‍රතිසාධනය, අනුවර්තනය සහ දේශගුණික හානි සඳහා වන ප්‍රතිචාර වෙනුවෙන් යොදාගත යුතුය.

9. අධ්‍යාපනය, අයිතිවාසිකම් පිළිබඳ දැනුවත්භාවය සහ ගරුත්වයක් සහිත ප්‍රතිසංස්කරණ හරහා දේශගුණික අනුකූලතාවය ශක්තිමත් කිරීම

බලධාරීන් විසින් සංස්කෘතිකමය වශයෙන් උචිත දේශගුණික අධ්‍යාපනය සහ පූර්ව අනතුරු ඇඟවීමේ සන්නිවේදනයන්, විශ්වාසනීය ප්‍රජා නාලිකා ඔස්සේ ලබා දිය යුතුය. ආධාර ලබා ගැනීමේදී පවතින පරිපාලනමය ක්‍රියා පටිපාටි සරල කළ යුතු අතර, ස්වාධීන ප්‍රජා අධීක්ෂණය සහිතව, දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තු දෙන සහ සංස්කෘතිකමය වශයෙන් ගැළපෙන ප්‍රමිතීන්ට අනුව නිවාස නැවත ගොඩනැඟිය යුතුය. ලබා දෙන සහන, පුණ්‍යාධාර ලෙස නොව අයිතිවාසිකම් මත පදනම් වූ වන්දි ලෙස ප්‍රතිසංවිධානය කළ යුතු අතර, ඒ හරහා වගවීම ඉල්ලා සිටීමට ප්‍රජාව බල ගැන්විය යුතුය.

10. පොදු ජනතාව මුල් කරගත් රාජ්‍ය දේශගුණික රක්ෂණ පද්ධතියක් ස්ථාපිත කිරීම

ආපදාවට පත් වූ නිවෙස්, ගොවීන්, ධීවරයන්, අනියම් සේවකයන් සහ කුඩා ව්‍යාපාරිකයන් වෙත කඩිනම් හා ප්‍රවේශ විය හැකි ගෙවීම් ලබා දෙන, රජයේ අනුග්‍රහය සහිත දේශගුණික අවදානම් රක්ෂණ යාන්ත්‍රණයක් රජය විසින් සකස් කළ යුතුය. එමගින් අවතැන් වීම්, අධ්‍යාපනයට බාධා පැමිණීම සහ මනෝ-සමාජීය හානි ඇතුළු ආර්ථික නොවන හානි හා අලාභ Non-Economic Loss and Damage පැහැදිලිවම ආවරණය කළ යුතුය. මෙම පද්ධතිය ලාභය අරමුණු කරගත් පෞද්ගලික ආකෘති ප්‍රතික්ෂේප කළ යුතු අතර, ඒ වෙනුවට ප්‍රධාන පරිසර දූෂකයන් සහ වැඩිපුර විමෝචනය කරන රටවල් මගින් මූල්‍යනය කළ යුතුය. මෙහිදී හිමිකම් පෑමේ ක්‍රියාවලිය සරල විය යුතු අතර කාන්තා මූලික නිවාස, ආබාධිත පුද්ගලයන් සහ අනියම් සේවකයන් සඳහා විශේෂ විධිවිධාන ඇතුළත් විය යුතුය.

දේශගුණික දූෂකයන් ලවා වන්දි ගෙවීමට සලස්වමු

දේශගුණික විපර්යාසයන්ට කිසිසේත්ම වගකිව යුතු නොවන, එහි පෙරමුණේම සිටින (Frontline) ප්‍රජාවන් අද තමන් නිර්මාණය නොකළ අර්බුදයකට වන්දි ගෙවමින් සිටිති. ලොව විශාලතම පරිසර දූෂකයන් ඒ සඳහා වගකීම දැරිය යුතු කාලය එළඹ ඇත. දකුණු ආසියාව පුරා දේශගුණික අර්බුදය දැන් තවදුරටත් දුරස්ථ තර්ජනයක් නොවේ. ගෝලීය විමෝචනය සඳහා අවම දායකත්වයක් ලබා දුන් රටවල ජීවිත සහ ජීවනෝපායන් ගංවතුර, සුළි කුණාටු, නායයෑම් සහ මුහුදු මට්ටම ඉහළ යාම හේතුවෙන් විනාශ වෙමින් පවතී.
2015 වසරේ සිට දකුණු ආසියාව පුරා අහිතකර දේශගුණික තත්ත්වයන් නිසා සිදු වූ ආර්ථික පිරිවැය ඩොලර් බිලියන ගණනක් වන අතර, මෙහි බලපෑමට සෘජුවම ලක්වන ප්‍රජාවන්ට කිසිදු සහායක් නොමැතිව එයට මුහුණ දීමට සිදු වී ඇත.
මෙය දේශගුණිකව සිදුවන අයුක්තියකි.
විශාලතම පොසිල ඉන්ධන දූෂකයන් විසින් සිදු කරන ලද හානිය වෙනුවෙන් ඔවුන් ලවා වන්දි ගෙවන ලෙස අපි ඉල්ලා සිටිමු. එමෙන්ම, හානියට පත් ප්‍රජාවන් විසින් මෙහෙයවනු ලබන සහ ඔවුන්ට පහසුවෙන් ලබාගත හැකි 'හානි සහ අලාභ' (Loss and Damage) සඳහා වන අරමුදල් පද්ධතියක් දූෂකයන්ගේ මූල්‍ය දායකත්වයෙන් ස්ථාපිත කළ යුතුය.

පොසිල ඉන්ධන කර්මාන්තය වගකීමට බැඳ තැබීම වෙනුවෙන් හඬ නැඟීමට එක්වන්න. මෙම පෙත්සමට අත්සන් තබා අපට සහාය වන්න.

Key References for Further Reading

1. Mustafa, Moiz. “Sri Lanka After Cyclone Ditwah: The Full Scale of the Disaster in Numbers - Breaking News.” Daily Mirror [Sri Lanka], 19 December 2025, https://www.dailymirror.lk/breaking-news/Sri-Lanka-After-Cyclone-Ditwah-The-Full-Scale-of-the-Disaster-in-Numbers/108-327523
2. Disaster Manegment Senter. “Disaster Manegment center - situation report, 4tn February 2026 - https://www.dmc.gov.lk/images/dmcreports/Situation_Summary_Report_(Ditwah)_at_1000hrs_on_2026__1770179560.pdf
3. Colombo Gazette, 3rd december, 2025, Cyclone Ditwah Leaves Over 275,000 Children in Sri Lanka in Urgent Need of Assistance, https://colombogazette.com/2025/12/03/cyclone-ditwah-leaves-over-275-000-children-in-sri-lanka-in-urgent-need-of-assistance
4. United Nations Situation Report, 23rd January 2026, Sri Lanka: Cyclone Ditwah Situation Report.06, https://srilanka.un.org/sites/default/files/2026-01/Cyclone_Ditwah__SitRep%20%236.pdf
5. World Bank Group, 22nd december, 2026, Damage from Cyclone Ditwah in Sri Lanka Estimate at $4.1 Billion, https://www.worldbank.org/en/news/press-release/2025/12/22/damage-from-cyclone-ditwah-in-sri-lanka-estimated-at-4-1-billion
6. India Times, 14th December, 2025, Operation Sagar Bandhu: India boosts connectivity restoration efforts in Sri lanka, https://timesofindia.indiatimes.com/india/operation-sagar-bandhu-india-boosts-connectivity-restoration-efforts-in-sri-lanka-watch/articleshow/125958305.cms
7. ACAPA, 5th December 2025, Sri Lanka Cyslone Ditwah, https://www.acaps.org/fileadmin/Data_Product/Main_media/20251205_ACAPS_Sri_-_Lanka___Cyclone_Ditwah_.pdf
8. Médecins Sans Frontieres - Doctors without Borders, 8th December 2025, Sri Lanka: MSF response to Cyclone Ditwah, https://msfsouthasia.org/sri-lanka-msf-response-to-cyclone-ditwah/
9. United Nations Sri Lanka, 11th December 2025, The United Nations and humanitarian partners call for US$35 MILLION to provide life-saving assistance to Sri Lankasas affected by Cyclone Ditwah, https://srilanka.un.org/en/306891-united-nations-and-humanitarian-partners-call-us35-million-provide-life-saving-assistance
10. Ceylon Today, Savani Sheshadhi, 9th December 2025, Ditwah’s Debris Danger Grows, https://ceylontoday.lk/2025/12/09/ditwahs-debris-danger-grows/.
11. President Secretariat, 13th January 2026, Rebuilding Sri Lanka’ National Initiative Launched Under the Patronage of the President, https://www.presidentsoffice.gov.lk/rebuilding-sri-lanka-national-initiative-launched-under-the-patronage-of-the-president/.
12. Colombo Gazette, 14th December 2025, ‘Rebuilding Sri Lanka’ Fund Top Rs. 3.4 Billion Following Cyclone Ditwah, https://www.presidentsoffice.gov.lk/rebuilding-sri-lanka-national-initiative-launched-under-the-patronage-of-the-president/.
13. Devdiscourse, 29th January 2026, Sri Lanka Unveils New Relief Measures for Cyclone- Hit Businesses, https://www.devdiscourse.com/article/business/3785732-sri-lanka-unveils-new-relief-measures-for-cyclone-hit-businesses.
14. Seychelles Nation, 9th December 2025, Operation Sagar Bandhu: India assists Sri Lanka following Cyclone Ditwah, https://www.nation.sc/articles/28514/operation-sagar-bandhu-india-assists-sri-lanka-following-cyclone-ditwah-
15. Disaster Management Center, 12th February 2026, Coordination of Emergency Donations to Rebuild the Country, https://www.dmc.gov.lk/index.php?Itemid=125&catid=8&id=1754%3Ajapan-hands-over-emergency-relief-supplies-to-support-cyclone-ditwah-affected-families-in-sri-lanka&lang=en&option=com_content&view=article&
16. Sri Lanka Guardian, 30th January 2026, U.S Engineers and Medics Join Sri Lanka’s Post - Cyclone Recovery Effort,https://slguardian.org/u-s-engineers-and-medics-join-sri-lankas-post-cyclone-recovery-effort/
17. UNFCC, “Sri Lanka’s Submission on the Strategic Workstream on Loss and Damage Action and Support.”, https://unfccc.int/files/adaptation/groups_committees/loss_and_damage_executive_committee/application/pdf/sri_lanka_submission.pdf
18. Faizer Shaheid, The Morning, 14th December 2025, Disaster management in Sri Lanka: No provisions for preparedness, https://srilankabrief.org/disaster-management-in-sri-lanka-no-provisions-for-preparedness/
19. Greenpeace South Asia, 12th December 2025, Change Intensified Cyclone Ditwah’s Impact in Sri Lanka: Greenpeace South Asia Call for Action, https://www.greenpeace.org/southasia/publication/20052/wwa-study-confirms-climate-change-intensified-cyclone-ditwahs-impact-in-sri-lanka-greenpeace-south-asia-calls-for-urgent-action/
20. Alind Chauhan, The Indian Express, 14th December 2025, 3 factors that made cyclones Ditwah & senyar so deadly, https://indianexpress.com/article/explained/explained-climate/cyclones-ditwah-senyar-10418543/lite/
21. IPCC, Fifty-fourth Session of the IPCC, 6th August 2021, “Working Group I contribution to the IPCC Sixth Assessment Report (AR6), Climate Change 2021: The Physical Science Basis”,https://www.ipcc.ch/site/assets/uploads/2021/09/Doc_4_Rev_2_AR6_WGI_Approved_Summary_for_Policymarkers.pdf
22. World weather Attribution, 10th December 2025, “Increasing heavy rainfall and extreme flood heights in a warming climate threaten densely populated regions across Sri Lanka and the Malacca Strait ”https://www.worldweatherattribution.org/increasing-heavy-rainfall-and-extreme-flood-heights-in-a-warming-climate-threaten-densely-populated-regions-across-sri-lanka-and-the-malacca-strait/
23. Simon Evans, Carbon Brief, 10th May 2021, Analysis: Which countries are historically responsible for climate change, https://www.carbonbrief.org/analysis-which-countries-are-historically-responsible-for-climate-change/
24. IPCC, 2023: Summary for Policymakers. In: Climate Change 2023: Synthesis Report. Contribution of Working Groups I, II and III to the Sixth Assessment Report of the Intergovernmental Panel on Climate Change, https://www.ipcc.ch/report/ar6/syr/downloads/report/IPCC_AR6_SYR_SPM.pdf
25. Climate Change Tracker, 14th November 2025, https://climatechangetracker.org/nations/greenhouse-gas-emissions/sri-lanka/historical-impact
26. IPCC, 6th June 2022, Losses and damages associated with slow-onset impacts of climate change: IPPC WG 2 assessment, https://unfccc.int/sites/default/files/resource/IPCC%20AR6_WGII.pdf
27. Jose Felix, IISD, 8th February 2022, How to Enforce the Polluter-Pays Principle, https://www.iisd.org/articles/polluter-pays-principle
28. Organisation for Economic Co-operation and Development, The Polluters Pays Principle - Definition analysis implementation, https://www.oecd.org/content/dam/oecd/en/publications/reports/1975/01/the-polluter-pays-principle_g1gh8f8f/9789264044845-en.pdf
29. Ceylon Today, 10th November 2022, Polluter Must Pay, https://ceylontoday.lk/2022/11/10/polluter-must-pay/
30. Dana Drugmand, tnl, 23rd April 2025, $9 trillion in heat damages traced to 5 fossil fuel giants, study finds,
31. https://www.thenewlede.org/2025/04/9-trillion-in-heat-damages-traced-to-5-fossil-fuel-giants-study-finds/
32. United Nations Sri Lanka, 3rd December 2025, Sri Lanka: Cyclone Ditwah Flash Update 4, https://srilanka.un.org/en/306413-sri-lanka-cyclone-ditwah-flash-update-4
33. UNDP, Climate Promise, Sri Lanka, September 2025, https://climatepromise.undp.org/what-we-do/where-we-work/sri-lanka